# පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමේ සිට කෝට්ටේ රාජධානිය ආරම්භය දක්වා ලංකාව පැවැත්වූ විදේශ සම්බන්ධතා

## (ක්‍රි.ව 1215-1415 දක්වා)

උදය නෙලුම් කාන්ති රත්නායක

දර්ශනපති උපාධි (ඉතිහාසය) 2014

# පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමේ සිට කෝට්ටේ රාජධානිය ආරම්භය දක්වා ලංකාව පැවැත්වූ විදේශ සම්බන්ධතා (ක්‍රි.ව 1215-1415 දක්වා)


උදය නෙලුම් කාන්ති රත්නායක

**GS/Mphil/HIS/3345/08**

**1351SS2008001**


ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා

*ඉතිහාසය* විෂය යටතේ ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

2014-12-18

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා ඉතිහාසය විෂය යටතේ ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය**

# *පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමේ සිට කෝට්ටේ රාජධානිය ආරම්භය දක්වා ලංකාව පැවැත්වූ විදේශ සම්බන්ධතා (ක්‍රි.ව 1215-1415 දක්වා)*

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය**

**ගංගොඩවිල**

# <u>පිදුම</u>

මා දිවියේ යෝධ සෙවණැල්ල සේ

නිරතුරු මා අසළ ම රැඳී සිටි

ආදරණීය අම්මාට ත් තාත්තාට ත් අයියාට ත්.....

## කර්තෘත්වයේ ප්‍රකාශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා මා විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මහාචාර්ය ඩී.ඇල්. අබේවර්ධන මහතා හා මහාචාර්ය පත්මසිරි කන්නන්ගර මහතා යන අයගේ සුපරීක්ෂණය යටතේ සම්පාදනය කරනු ලැබූ බවත්, මෙම පර්යේෂණ කෘතිය කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් වශයෙන් හෝ වෙනත් කිසිදු විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ වෙනත් පශ්චාද් උපාධියක්, ඩිප්ලෝමාවක් සඳහා හෝ ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

.....................

දිනය ...............                                        අත්සන

## අධ්‍යයනාංශ ප්‍රධානතුමා ගේ සහතිකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය (ඉතිහාසය) සඳහා ඉහත නම සඳහන් අපේක්ෂකයා විසින් අනුමත කරන ලද මාතෘකාව යටතේ සම්පාදනය කරන ලද පර්යේෂණ නිබන්ධය ඇගයීම් කටයුතුවලදී පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කළ නිර්දේශවලට අනුව අවසන් කර ඇති බවට නිර්දේශ කරමි.

……………………..

දිනය ……………                                        අත්සන

## උපදේශකවරුන් ගේ සහතිකය

මෙම අපේක්ෂකයා විසින් සිදු කරන ලද ඉහත ප්‍රකාශය සත්‍ය බවත්, මෙම පර්යේෂණ නිබන්ධය ආරම්භයේ සිට අවසානය දක්වා අපගේ සුපරීක්ෂණය යටතේ සිදු කරන ලද බවත්, එය ඇගයීම් කාර්ය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමෙන් පසුව පැවති වාචික පරීක්ෂණයේ දී පරීක්ෂකවරුන් විසින් නිර්දේශ කළ ආකාරයට සම්පාදනය කර ඇති බවත් නිර්දේශ කරමු.

……………………

දිනය ……………                                        අත්සන

මහාචාර්ය ඩී. ඇල්. අබේවර්ධන

සම උපදේශක

……………………

දිනය ………………

අත්සන

මහාචාර්ය පත්මසිරි කන්නන්ගර

සම උපදේශක

# <u>පටුන</u>


පිළිගැන්වීම

පටුන i-vii

ඡායාරූප නාමාවලිය viii

වගු නාමාවලිය ix

සිතියම් නාමාවලිය x

ස්තුතිය xi

සංක්ෂිප්තය xii

හැඳින්වීම xiii-xxii

කෙටි යෙදුම් xxiii-xxv

*පිටු අංක*

<u>**පළමු වැනි පරිච්ඡේදය**</u> 01-104

***හැඳින්වීම, මූලාශ්‍රය විග්‍රහය හා පැරණි ලංකාවේ විදේශ සබඳතාවල ස්වරූපය***

**1.1 හැඳින්වීම**

1.1.1 න්‍යාය හා සංකල්ප විග්‍රහය

1.1.2 විදේශ සම්බන්ධතා සංකල්පයේ ඓතිහාසික විකාශය

**1.2 විදේශ සම්බන්ධතා සංකල්පයේ අධ්‍යයන ක්‍රමවේද**

**1.3 පර්යේෂණ ක්‍රමවේදය**

**1.4 මූලාශ්‍රය විග්‍රහය**

**1.5 රජරට ශිෂ්ටාචාර සමයේ ලංකාවේ විදේශ සම්බන්ධතාවල ස්වරූපය**

1.5.1 විදේශ සම්බන්ධතා කෙරෙහි බලපෑ සාධක

1.5.1.1 ලංකාවේ පිහිටීම

1.5.2. ස්වාභාවික වරාය පද්ධතිය

1.5.3. මෝසම් සුළඟේ ක්‍රියාකාරීත්වය

**1.6 ලංකාව විදේශ සම්බන්ධතා පැවැත්වූ ප්‍රධාන සාමුද්‍රික කලාප**

1.6.1. අරාබි සාගරික කලාපය

1.6.2. බෙංගාල සාගරික කලාපය

1.6.3. රතු මුහුද ආශ්‍රිත සාගරික කලාපය

**1.7 වෙළඳ ද්‍රව්‍ය**

1.7.1 අපනයනය කළ වෙළඳ ද්‍රව්‍ය

1.7.2 ආනයනය කළ වෙළඳ ද්‍රව්‍ය

**1.8 රජරට ශිෂ්ටාචාර සමයේ ලංකාව පැවැත්වූ දේශපාලන සම්බන්ධතා**

1.8.1. හැඳින්වීම

1.8.1.1. ආක්‍රමණ ස්වරූපයේ සම්බන්ධතා

1.8.1.2. අනුරාධපුර රාජධානි සමයේ ඉන්දියාව සමඟ පැවැති ආක්‍රමණකාරී සම්බන්ධතා

**1.9 රජරට ශිෂ්ටාචාර සමයේ ලංකාව හා විදේශ රාජ්‍යයන් අතර පැවති වාණිජ සම්බන්ධතා**

1.9.1. රජරට ශිෂ්ටාචාර සමයේ ඉන්දියාව සමඟ පැවැත්වූ වාණිජ සම්බන්ධතා

1.9.2 රජරට ශිෂ්ටාචාර සමයේ චීනය ප්‍රධාන ඈත පෙරදිග රාජ්‍ය සමඟ පැවැත්වූ වාණිජ සම්බන්ධතා

1.9.3 රජරට ශිෂ්ටාචාර සමයේ අපරදිග රාජ්‍ය සමඟ පැවැත්වූ වාණිජ සම්බන්ධතා

1.9.4 රජරට ශිෂ්ටාචාර සමයේ අරාබිය ප්‍රධාන මධ්‍ය ආසියාතික රාජ්‍ය සමඟ පැවැත්වූ වාණිජ සම්බන්ධතා

**1.10 රජරට ශිෂ්ටාචාර සමයේ ලංකාව හා විදේශ රාජ්‍යයන් අතර පැවති සංස්කෘතික සම්බන්ධතා**

1.10.1. රජරට ශිෂ්ටාචාර සමයේ ඉන්දියාව සමඟ පැවැත්වූ සංස්කෘතික සම්බන්ධතා

1.10.2 රජරට ශිෂ්ටාචාර සමයේ චීනය හා අග්නිදිග ආසියාතික රාජ්‍ය සමඟ පැවැත්වූ සංස්කෘතික සම්බන්ධතා

**<u>දෙවැනි පරිච්ඡේදය</u>** 105-142

***පොළොන්නරුව රාජධානිය බිඳවැටීමෙන් පසු මෙරට දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික ඉතිහාසය (ක්‍රි.ව 1215-1415)***

**2.1 රජරට ශිෂ්ටාචාරයේ පිරිහීම**

**2.2 දඹදෙණිය රාජධානි සමය**

2.2.1 දේශපාලන ඉතිහාසය

2.2.1 ආගමික තොරතුරු

2.2.2 ගෘහ නිර්මාණ ශිල්පය හා කලා නිර්මාණ

2.2.3 සාහිත්‍ය

**2.3 යාපහුව රාජධානි සමය**

2.3.1 කලා නිර්මාණ

**2.4 කුරුණෑගල රාජධානිය**

2.4.1 සංස්කෘතික කටයුතු

**2.5 ගම්පොළ රාජධානිය**

2.5.1 ගම්පොළ සමයේ ආගමික කටයුතු

2.5.2 ගම්පොළ සමයේ වාස්තු විද්‍යා ලක්ෂණ

2.5.3 ගම්පොළ සමයේ සාහිත්‍යය

**2.6 කෝට්ටේ රාජධානිය**

<u>**තුන්වැනි පරිච්ඡේදය**</u> **143-190**

***දකුණු ආසියාතික රාජ්‍ය සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා***

හැඳින්වීම

**3.1 පාණ්ඩ්‍ය රාජ්‍ය සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා**

3.1.1 දේශපාලන සම්බන්ධතා

3.1.2 දඹදෙණිය රාජ්‍ය සමයෙන් පසු පාණ්ඩ්‍ය - ලංකා දේශපාලන සම්බන්ධතා

3.1.3 පාණ්ඩ්‍ය වංශය හා වන්නිවරු

**3.2. කේරළ- ලංකා දේශපාලන සම්බන්ධතා**

**3.3. උතුරු ඉන්දියාවේ රාජස්ථානය සමඟ පැවති සම්බන්ධතා - රාජ්පුත් වංශිකයින්**

**3.4. ඉන්දියානු රාජ්‍ය සමඟ පැවති වාණිජ සම්බන්ධතා**

3.4.1 ලංකාව තුළ ක්‍රියාත්මක වූ දකුණු ඉන්දියානු වෙළඳ සංවිධාන

3.4.1.1 වෙළඳ සංවිධානවල ක්‍රියාකාරීත්වය හා එහි ව්‍යාප්තිය

3.4.1.2. ලංකාව තුළ වෙළඳ සංවිධානවල ක්‍රියාකාරීත්වය

3.4.2 ලංකාව තුළ හා ඉන්දියාව අතර පැවති වාණිජ කටයුතු

3.4.2.1 හැඳින්වීම

3.4.3 ලංකාවේ ව්‍යාප්ත දකුණු ඉන්දියානු වෙළඳ සංවිධාන

3.4.3.1 අයින්නූර්රුවර්

3.4.3.2 වීරකෝති

3.4.3.3 වීරමකලම්

3.4.3.4 වලංසියාර් සහ වේලෛක්කාර

3.4.3.5 මනික්ග්‍රාමන් හෙවත් වණික්ග්‍රාම

3.4.3.6 චෙත්ති හෙවත් චෙට්ටියාර්වරු

3.4.3.7 අන්ජුවන්නම්

3.4.3.8 නකරම් හෙවත් නගරම්

3.4.3.9 නන්කුනතු

3.4.3.10 නානාදේසී

<u>**සිව්වැනි පරිච්ඡේදය**</u> **191-232**

***නැගෙනහිර ආසියාතික රාජ්‍ය සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා***

**4.1 චීන රාජ්‍ය සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා**

4.1.1 ඓතිහාසික පසුබිම

4.1.2. වෙළඳ මාර්ග

4.1.3. ඉන්දියානු සාගරය සමඟ පැවති සබඳතා

**4.2 චීන - ලංකා සම්බන්ධතා**

4.2.1 දේශපාලන සබඳතා

4.2.1.1 චෙන් හෝ සෙන්පතිවරයා හා මෙරට දේශපාලන කටයුතු

4.2.2 වාණිජ සබඳතා

4.2.2.1 ක්‍රි.ව 13 වැනි සියවස වනවිට පැවති වාණිජ සම්බන්ධතා

4.2.2.3 ලංකාවේ පුරාවිද්‍යාත්මක කැණීම් සාධක

4.2.2.3.1 උතුරු, වයඹ දිග හා නැගෙනහිර වෙරළ

4.2.2.3.2 පොළොන්නරුව ආළාහන පිරිවෙන ව්‍යාපෘතිය

4.2.2.3.3 යාපහුව ව්‍යාපෘතිය

4.2.2.4 චීන ජාතිකයින් මධ්‍යධරණී ප්‍රදේශයේ සිදුකළ වෙළඳ කටයුතු

4.2.3 ක්‍රි.ව 13 වැනි සියවසින් පසු චීනය සමඟ පැවති වෙළඳ සබඳතා

4.2.4 පුරාවිද්‍යාත්මක කැණීම් සාධක

4.2.4.1 යාපහුව වැඩ භූමියෙන් හමුවන චීන සෙරමික් භාණ්ඩ

4.2.4.2 ගාලු වරාය ව්‍යාපෘතිය

4.3 සංස්කෘතික සම්බන්ධතා

**පස් වැනි පරිච්ඡේදය** 233-289

*අග්නිදිග ආසියාතික රාජ්‍ය හා ලංකාව අතර පැවති සම්බන්ධතා*

**5.1 සුබෝදය රාජ්‍ය හා ලංකාව අතර සිදුවූ දේශපාලන කටයුතු**

5.1.1 ජාවක චන්ද්‍රභානු ආක්‍රමණය

5.1.2 තම්බලිංගාධිපති චන්ද්‍රභානු

5.1.3 තායිලන්තයේ සීහල බුද්ධ පටිමාව

**5.2 අග්නිදිග ආසියාතික රාජ්‍ය සමඟ ලංකාව පැවැත්වූ වෙළඳ සම්බන්ධතා**

5.2.1 ඓතිහාසික පසුබිම

5.2.2 වෙළඳ මාර්ග

5.2.3 වාණිජ සබදතා

5.2.3.1 බුරුමය - ඓතිහාසික පසුබිම

5.2.3.2 විජය නගර් සම්බන්ධතා

5.2.3.3 ජාවා

5.2.3.4 සුමාත්‍රා

**5.3 සුබෝදය රාජ්‍ය හා ලංකාව අතර පැවති සංස්කෘතික සම්බන්ධතා**

5.3.1 ඓතිහාසික පසුබිම

5.3.2 තායි ලංකා ආගමික හා සංස්කෘතික සබදතා

**5.4 බුරුමය හා ලංකාව අතර ආගමික සම්බන්ධතා**

5.4.1 ඓතිහාසික පසුබිම

5.4.2 ලංකා බුරුම ආගමික හා සංස්කෘතික සම්බන්ධතා

5.4.2.1 බුරුම රාජ්‍යයේ පගාන් අවධිය

5.4.2.2 පගාන් අවධියට පසු යුගය

**<u>හයවැනි පරිච්ඡේදය</u>** 290-325

***බටහිර ආසියාතික හා අපරදිග රාජ්‍ය සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා***

**6.1 අරාබි - ලංකා වෙළඳ සබඳතා**

6.1.1 ඓතිහාසික පසුබිම

6.1.2 නැගෙනහිර අප්‍රිකානු රාජ්‍ය සමඟ පැවති වෙළඳ සබඳතා

6.1.3 බටහිර ඉන්දියානු රාජ්‍ය

6.1.4 මධ්‍ය ආසියානු රාජ්‍ය

**6.2 මුස්ලිම්වරුන් ලංකාව සමඟ පැවැත්වූ ආගමික හා සංස්කෘතික සම්බන්ධතා**

6.2.1 ශ්‍රී පාද වන්දනය

**6.3 අපරදිග රාජ්‍ය සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතාවල ස්වරූපය**

සමාලෝචනය

උපග්‍රන්ථය

ඡායාරූප

ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය

## ඡායාරූප නාමාවලිය


ඡායාරූප අංක 01 - නානාදේසීවරුන් ගේ වීරභද්‍ර මුද්‍රාව - අනුරාධපුරය

ඡායාරූප අංක 02 - නානාදේසීවරුන් ගේ මුද්‍රාව - ගාල්ල

ඡායාරූප අංක 03 - චීන බඳුනක් - යාපනය

ඡායාරූප අංක 04 - චීන බඳුන් කැබැල්ලක්

ඡායාරූප අංක 05 - චීන බඳුන් කැබැල්ලක්

ඡායාරූප අංක 06 - චීන බඳුන් කැබලි එකතුවක්

ඡායාරූප අංක 07 - චීන බඳුන් කැබැලි එකතුවක්

ඡායාරූප අංක 08 - චීන බඳුන් කැබැලි එකතුවක්

ඡායාරූප අංක 09 - ආභරණ එකතුවක්

ඡායාරූප අංක 10 - චීන කාසි එකතුවක්

ඡායාරූප අංක 11 - චීන බඳුනක්

ඡායාරූප අංක 12 - චීන බඳුනක්

ඡායාරූප අංක 13 - චීන බඳුනක්

ඡායාරූප අංක 14 - චීන බඳුනක්

ඡායාරූප අංක 15 - චීන බඳුනක්

ඡායාරූප අංක 16 - චීන බඳුන් කැබැලි එකතුවක්

ඡායාරූප අංක 17 - චීන බඳුන් කැබැලි එකතුවක්

ඡායාරූප අංක 18 - චීන බඳුන් කැබැලි එකතුවක්

## <u>වගු නාමාවලිය</u>

වගුව අංක 01- වෙළඳ ශ්‍රේණිවල වර්ෂ අනුක්‍රමයෙන් රටරටවල ශිලාලේඛන ව්‍යාප්තිය

වගුව අංක 02 - චීන රාජ්‍යයේ දහවැනි සියවස සිට විසිවැනි සියවස දක්වා කැපී පෙනෙන රාජවංශ

වගු අංක 03 - ෂැං හි ගේ යාත්‍රා ගමන් පිළිබඳ විස්තරය

# සිතියම් නාමාවලිය

සිතියම අංක 01 - ඈත අතීතයේ සිට ක්‍රි.ව 15 වැනි සියවස අතර කාලයේ ලංකාව විදේශ සම්බන්ධතා පැවැත්වූ කලාප

සිතියම අංක 02 - ක්‍රි.ව. 13-15 වැනි සියවස්වල විදේශ සම්බන්ධතාවලට අදාල කරුණු ඇතුළත් ශිලා ලේඛනවල ව්‍යාප්තිය

සිතියම අංක 03 - ක්‍රි.ව. 8-15 වැනි සියවස්වල විදේශ වෙළදාම සම්බන්ධයෙන් පුරාවිද්‍යාත්මක සාධක හමුවන ස්ථාන

සිතියම අංක 04- ක්‍රි.ව 13-15 වැනි සියවස්වල අරාබි ලංකා සම්බන්ධතා තහවුරු වන පුරාවිද්‍යාත්මක සාධක හමුවන ස්ථාන

සිතියම අංක 05- ක්‍රි.ව 13-15 වැනි සියවස් අතර කාලයේ ලංකාව විදේශ සම්බන්ධතා පැවැත්වූ අරාබි සාගර කලාපය හා එම කලාපය සමඟ සම්බන්ධතා පැවැත්වූ මෙරට ප්‍රාදේශීය ස්ථානවල ව්‍යාප්තිය

## ස්තුතිය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධි ඉතිහාසය විෂය යටතේ ඉදිරිපත් කරන මෙම පර්යේෂණ නිබන්ධය සාර්ථක ලෙස සම්පාදනය කොට අවසන් කිරීම සඳහා මාහට සහයෝගය ලබාදුන් පිරිස අපමණ ය. රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු ක්‍රි.ව 13-15 වැනි සියවස් අතර කාලයේ මෙරට ප්‍රධාන රාජධානි මායා රටට විතැන්වීමේ කාලපරිච්ඡේදය අළලා විවිධ විද්වතුන් විසින් අවස්ථා ගණනාවක දී තේමාවන් කිහිපයක් ඔස්සේ සිය පර්යේෂණ කටයුතු සිදුකර ඇත. එහෙත් මෙම කාලවකවානුවේ දී ලංකාව වෙනත් රාජ්‍යයන් සමඟ පැවැත්වූ විදේශ සම්බන්ධතා පිළිබඳ අවධානය යොමුවී ඇත්තේ අල්ප වශයෙනි. එබැවින් මෙම කාලපරිච්ඡේදයේ ලංකාව හා විදේශ රාජ්‍යයන් අතර පැවති සම්බන්ධතාවල ස්වරූපය අධ්‍යයනය කිරීම සඳහා මා යොමු කරමින් පර්යේෂණය ආරම්භයේ සිට අවසානය දක්වා මාහට නිසි මාර්ගෝපදේශකත්වය සැපයූ මහැදුරු ඩී.ඇල් අබේවර්ධන හා පත්මසිරි කන්නන්ගර යන ආචාර්ය භවතුන්ට මාගේ කෘතඥතාවය ප්‍රථමයෙන්ම හිමි විය යුතුය. මෙම මාතෘකාව ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ සඳහා අවසරය ලබාදෙමින් පර්යේෂණ කටයුතුවල නියැලීමට අවස්ථාව උදාකර දුන් ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතාට ද ස්තුතිවන්ත විය යුතුය. පර්යේෂණ මාතෘකාව අනුමත කර ගැනීමේ සිට එහි අධ්‍යයන කටයුතු නිවැරදිව සිදුකර ගෙන යෑමට බාහිර පරීක්ෂකවරයෙකු ලෙස සම්බන්ධ වෙමින් අවශ්‍ය උපදෙස් සැපයූ සේවාර්ජිත මහාචාර්ය මාලනී ඇඳගම මහත්මියට ද කෘතඥ වෙමි. මෙම අධ්‍යයනය තුළදී පැන නගින විවිධ වූ ගැටලු නිරාකරණය කර ගැනීමටත් පර්යේෂණ නිබන්ධය සාර්ථකව අවසන් කිරීම සඳහාත් අවශ්‍ය මානසික ශක්තිය නිරතුරුව ලබාදුන් අප අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයට හා අනධ්‍යන කාර්ය මණ්ඩලයට ද මම බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

මෙම පර්යේෂණය සිදුකිරීමේ දී අවශ්‍ය පොතපත සපයාදීමට කාරුණික වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනය කැළණිය විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලවල පුස්තකාලයාධිපතිවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයටත් රාජකීය ආසියාතික සංගමයේ පුස්තකාලය, ජාතික පුස්තකාලය, ජාතික කෞතුකාගාර පුස්තකාලය හා රාජ්‍ය ලේඛනාගාර දෙපාර්තමේන්තුවේ සේවක මහත්ම මහත්මීන්ට ද මාගේ හදපිරි ස්තුතිය නිතැතින්ම හිමි වේ. අවශ්‍ය පුරාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය සඳහා අවස්ථාව උදාකර දුන් ජාතික කෞතුකාගාරය, ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය, යාපනය කෞතුකාගාරය හා දඹදෙණිය, යාපහුව, පඬුවස්නුවර, කුරුණෑගල, රිදීවිහාරය, ගම්පොළ හා කෝට්ටේ ආදි පුරාවිද්‍යා ස්ථානවල ව්‍යාපෘති භාර ප්‍රධානීන්ට හා සෙසු නිලධාරීන් ද සිහිපත් කරමි.

පුරා වසර ගණනාවක් පුරා අඛණ්ඩව පර්යේෂණ කටයුතුවල නියැලෙමින් මා ලද අවසන් ජයග්‍රහණය පිටුපස සිටිනුයේ ආදරණීය ආම්මාත් තාත්තාත් මාගේ ස්වාමි පුරුෂයාත් ය. සාර්ථක පර්යේෂණයක වෙහෙස මහන්සි වී නියැලීමට අවශ්‍ය මානසික ශක්තිය, මූල්‍ය ශක්තිය ලබාදීමෙන් පමණක් නොව සෙවණැල්ල සේ සිටිමින් මා නිරතුරු දිරිමත් කළ මා මෙන්ම නිදිවරා මට ශක්තිය ලබාදුන් ඔබ තිදෙනාගේ කැපවීම හා ඉවසීම මා බෙහෙවින් අගය කරන අතර එයට හදපිරි ස්තුතිය මෙසේ පළ කරමි.

## සාර සංක්ෂිප්තය

ශ්‍රී ලංකාව සමඟ අතීතයේ සිටම වෙනත් රාජ්‍යයන් නොයෙකුත් ආකාරයේ සම්බන්ධතා පවත්වන්නට යෙදුණි. භූගෝලීය වශයෙන් පෙර අපරදෙදිග රාජ්‍යයන් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීමට හැකිවීම නිසා හුදෙකලා බවින් මිදී නිරන්තරයෙන් කුමන හෝ රාජ්‍යයක් සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමට මේ දිවයින නිතැතින්ම යොමු වී ඇත. අනුරාධපුරය හා පොළොන්නරුව කේන්ද්‍ර කරගත් රජරට ශිෂ්ටාචාර සමයේ දී අසල්වාසී ඉන්දියාව ප්‍රධාන දකුණු ආසියාතික රාජ්‍ය සමඟ වැඩි වශයෙන් සම්බන්ධතා පැවැත්වීමට යොමු වූ ආකාරයක් දක්නට ලැබේ. එහෙත් රජරට ශිෂ්ටාචාරය ක්‍රි.ව 1215 පමණ වන විට පරිහානිය කරා ළගා වුයෙන් රාජ්‍ය මධ්‍යස්ථාන ක්‍රමයෙන් මායා රට වෙත ඇදෙන්නට විය. නව භූ භෞතික පසුබිමක් තුළ මේ අවධියේ පාලකයින් ප්‍රධාන සියලු කණ්ඩායම් නව දේශපාලන, සමාජ, ආර්ථික හා ආගමික නැඹුරුතාවයක් සඳහා යොමු වන්නට විය. එම පසුබිම තුළ මෙතෙක් ක්‍රියාත්මක වූ විදේශ ප්‍රතිප්තතිය ද ක්‍රමයෙන් වෙනස් වී ඇත.

රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු නිරිතදිග ප්‍රදේශයට පැමිණි පාලකයින් නව ආර්ථික ක්‍රමවේද කෙරෙහි අවධානය යොමු කර ඇත. එහිදී සමකාලීනව ලෝක දේශපාලන, ආර්ථික පසුබිම තුළ නව විදේශ සම්බන්ධතා ජාලයක් ක්‍රියාත්මකවීම ආරම්භ කෙරිණි. ඒ අනුව මෙතෙක් ඉන්දියානු උපමහාද්වීපයට වඩාත් යොමු වූ ලාංකීය විදේශ සම්බන්ධතා නව රාජ්‍යයන් හා රාජ්‍ය වංශයන් දක්වා පුලුල්වීමක් මේ අවධිය සම්බන්ධව අධ්‍යයනයෙන් පැහැදිලි වේ. ක්‍රි.ව දහතුන් වැනි සියවස වනවිට ක්‍රමයෙන් නැගී එමින් සිටි නැගෙනහිර ආසියාතික රාජ්‍යයක් වශයෙන් චීන අධිරාජ්‍යය වඩාත් බලවත්වීම ද මෙරට විදේශ සම්බන්ධතා ගොඩනැගීම කෙරෙහි බලපාන්නට විය. එසේම දකුණු ඉන්දියාව තුළ සිදුවන දේශපාලන වෙනස්කම් හා ව්‍යාකුලතා සෘජුව මෙරටට බලපෑම් එල්ල කරන්නට විය. මෙබඳු පසුබිමක් උදාවුයේ මේ අවධිය තුළ රාජ්‍යයන් සියල්ලක්ම පාහේ එක්ව බැඳී සිටි විදේශ සම්බන්ධතා ජාලයක් පවත්වාගෙන යෑම හේතුවෙන් බව පැහැදිලි වේ.

මෙම අධ්‍යයනය තුළදී රජරට ශිෂ්ටාචාර සමයේ අනුගමනය කරන ලද විදේශ ප්‍රතිපත්තියට වඩා වෙනස් අරමුණු ඇතිව මෙරට විදේශ සම්බන්ධතා පැවැත්වීම සිදුවූ ආකාරය පැහැදිලි විය. තත් කාලීනව ලෝක දේශපාලනය තුළ මෙන්ම ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම් මෙරටට ද එලෙසින්ම බලපෑම් එල්ල කරන්නටවීම මෙම අධ්‍යයනය තුළින් තහවුරු වූ මූලික කරුණකි.

# <u>හැඳින්වීම</u>

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම අතීතයේ සිටම මෙරට විදේශ සම්බන්ධතා හැඩගැස්වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකයකි. ඉන්දියානු උපමහාද්වීපයට ආසන්නව ඊට දකුණු දිගින් දූපතක් වශයෙන් පිහිටා තිබීමත්, ලංකාව වටා ස්වාභාවික වරාය පද්ධතියක් සමග ගොඩබිම හා සම්බන්ධතා පැවැත්වීමට සුදුසු මුහුදු වෙරළක් පිහිටා තිබීමත්, මුහුදු වෙරළෙහි සිට රට අභ්‍යන්තරයට ගමන් කළ හැකි ගංගා ද්‍රෝණි පද්ධතියක් පිහිටා තිබීමත් යන ප්‍රධාන භූගෝලීය සාධක දිවයිනෙහි විදේශ සම්බන්ධතා පවත්වා ගෙනයෑම කෙරෙහි බලපෑවේ ය. ශ්‍රී ලංකාවේ භූගෝලීය පරිස්ථිතියේ තවත් එක් වැදගත් ලක්ෂණයක් වන්නේ පෙර අපරදෙදිග මුහුදු මාර්ගයේ වැදගත් මධ්‍යස්ථානයක් වශයෙන් පිහිටා තිබීම ය. මෙම භෞතික හා ස්වාභාවික සාධකවලට අමතරව ක්‍රි.පූ තුන්වැනි සියවසින් පසුව ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස ආසියාවේ සෙසු රටවල් අතර ලංකාවට ප්‍රමුඛස්ථානය ලැබීමත්, අතීතයේ ඉන්දියාව හා ලංකාව වැනි රටවල් අතර සන්නිවේදන කටයුතු සඳහා භාවිතා කෙරුණු පාලි භාෂාව හා සංස්කෘත භාෂාව මෙරට භාවිතාවීමත්, ථෙරවාදය හා මහායානය වැනි බෞද්ධ සම්ප්‍රදායන් දෙකම අධ්‍යයනය කළ අභයගිරිය වැනි ජාත්‍යන්තර තලයේ අධ්‍යාපන ආයතන පැවතීමත් වැනි කරුණු ද මෙරට විදේශ සම්බන්ධතා කෙරෙහි බලපෑ බව පැහැදිලි ය.

ක්‍රි.ව 13 වැනි සියවස ආරම්භය දක්වා පිළිවෙළින් අනුරාධපුරය හා පොළොන්නරුව රාජධානි කේන්ද්‍ර කර ගනිමින් පැවති රජරට ශිෂ්ටාචාරය ක්‍රි.ව 1215න් පසුව ක්‍රමයෙන් තෙත් කලාපය දෙසට ව්‍යාප්තවීමට කරුණු සැලසිණි. මේ අනුව රජරට ශිෂ්ටාචාර සමයේ ශතවර්ෂ 15කට වැඩි කලක් ලංකාවේ පැවති සාම්ප්‍රදායික විදේශ ප්‍රතිපත්තිය ද එම ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු යම් යම් වෙනස්කම්වලට භාජනය වූ බව දක්නට ලැබේ. මෙම අධ්‍යයනයේ දී මෙරට විදේශ සම්බන්ධතා නව මඟකට යොමු වූ ආකාරය හා විදේශ සම්බන්ධතාවල ස්වරූපය පිළිබඳව සවිස්තරාත්මකව කරුණු සලකා බැලීමට අපේක්ෂාව කෙරේ.

පොළොන්නරුව රාජධානිය බිඳවැටීමේ සිට කෝට්ටේ රාජධානිය ආරම්භය දක්වා ලංකාවේ විදේශ සම්බන්ධතා කෙරෙහි අවධානය යොමු කෙරෙන මෙම අධ්‍යයනයේ දී ප්‍රස්තුතයට අදාළව මෙතෙක් සිදුකර ඇති පර්යේෂණ පිළිබඳ ප්‍රමාණාත්මක විග්‍රහයක යෙදීම අත්‍යවශ්‍ය වේ. සමස්තයක් වශයෙන් සලකා බලන විට විවිධ කාලපරිච්ඡේදවල ලංකාවේ විදේශ සම්බන්ධතා පිළිබඳ දේශීය හා විදේශීය විද්වතුන් පර්යේෂණ රැසක් සිදුකර තිබේ. එහෙත් මෙම මාතෘකාවේ කාලපරිච්ඡේදයට අදාළව <u>*විදේශ සම්බන්ධතා*</u> පිළිබඳ පුළුල් අවධානයක් යොමු කෙරුණු ප්‍රමාණවත් අධ්‍යයනයක් මෙතෙක් සිදුකර නැති බව එම පර්යේෂණ අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. මෙම කාලවකවානුවේ සමකාලීන දේශපාලන, සමාජ, ආර්ථික, ආගමික හා සංස්කෘතික තත්ත්වයන් පිළිබඳ විවිධ පර්යේෂණ සිදුවී ඇති බව සඳහන් කළ යුතුය. එකී පර්යේෂණ මෙම ප්‍රස්තුත අධ්‍යයනයට සම්බන්ධ වන ආකාරය තේමා කිහිපයක් ඔස්සේ විග්‍රහ කළ හැකිය.

*මෙම කාලපරිච්ඡේදයට අදාළ වෙනත් මාතෘකා යටතේ සිදුකෙරුණු පර්යේෂණවලදී විදේශ සම්බන්ධතා පිළිබඳව ද අවධානය යොමු කෙරෙන පර්යේෂණ* කිහිපයක් වේ. ඒ අතර කැළණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ ආචාර්ය අමරදාස ලියනගමගේ විසින් වර්ෂ 1963 දී සිය දර්ශනසූරි (PhD) උපාධිය සඳහා ලන්ඩන් විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද **The Decline of Polonnaruwa and The Rise of Dambadeniya (circa 1180-1270 A.D)** නම් පර්යේෂණ නිබන්ධයට විශේෂ තැනක් හිමිවේ.[1] (මෙම පර්යේෂණ නිබන්ධය *මධ්‍ය කාලීන ලංකා ඉතිහාසය* නමින් 1989 වර්ෂයේ දී අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් සිංහල භාෂාවට පරිවර්තනය කර ඇත.)[2] පොළොන්නරුව රාජධානිය බිඳවැටීමෙන් අනතුරුව සිංහල රාජධානි මායා රටේ විතැන්වීම පිළිබඳ අවධානය යොමු කරමින් සිදුකරන ලද මුල්ම පර්යේෂණයක් ලෙසින් මෙම නිබන්ධය සැලකිය හැකිය.

සමකාලීනව දකුණු ඉන්දියාවේ පාලන බලය මෙහෙයවූ පාණ්ඩ්‍ය පාලකයින් සමඟ සම්බන්ධාත පැවැත්වීමේ දී රජු අනුගමනය කළ දේශපාලන ප්‍රතිපත්තිය හා පාණ්ඩ්‍ය - සිංහල රාජවංශ අතර එවකට වර්ධනය වෙමින් පැවති දේශපාලන සන්ධානය පිළිබඳව මෙම පර්යේෂණයේ දී අවධානය යොමුකර තිබෙන අතර එම තොරතුරු සනාථ කිරීම සඳහා පාණ්ඩ්‍ය දේශයේ රචිත සෙල්ලිපි සාධක කිහිපයක් යොදා ගෙන ඇත. ලංකා ඉතිහාසයේ තවත් වැදගත් සිදුවීමක් වන චන්ද්‍රභානු නම් ජාවක රජුගේ ආක්‍රමණ පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කර තිබේ. මෙම තත්ත්වය අධ්‍යයනය කිරීම තුළින් අග්නිදිග ආසියාතික රාජ්‍ය සමඟ එකල ලංකාව පැවැත්වූ සම්බන්ධතා කෙබඳු ස්වරූපයක් ගනු ලැබුවේ ද යන්න පිළිබඳ තොරතුරු හෙළි කෙරේ. සමස්තයක් වශයෙන් බලන විට මෙම පර්යේෂණය දඹදෙණි රාජධානි සමය හා එහි දේශපාලන තොරතුරු කෙරෙහි අවධානය යොමුවූ එකක් වන අතර අදාළ කාලපරිච්ඡේදයේ ලංකාවේ විදේශ සම්බන්ධතා පිළිබඳ සම්පූර්ණ අධ්‍යයනයක් සිදුවී නොමැති බව එහි අන්තර්ගතයෙන් පැහැදිලි වේ.

ක්‍රි.ව 13-15 වැනි සියවස් අතර කාලපරිච්ඡේදයට අදාළව විදේශීය විශ්වවිද්‍යාල සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධ හැරුණු විට දේශීය විශ්වවිද්‍යාලවල යම් යම් උපාධි අවශ්‍යතා සඳහා සම්පාදිත නිබන්ධ කිහිපයක් දැකගත හැකිය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ ආචාර්ය පී.ඒ.ටී. ගුණසිංහ සිය දර්ශනසූරි (PhD) උපාධිය සඳහා වර්ෂ 1980 දී එම විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කළ **The Political History of Yapahuwa, Kurunegala and Gampola** යන මෙම පර්යේෂණ නිබන්ධය ප්‍රස්තුත මාතෘකාවට අදාළ තවත් වැදගත් කෘතියකි.[3] මෙම පර්යේෂණයේ දී යාපහුව රාජධානියේ ප්‍රභවය හා පළමුවැනි බුවනෙකබාහු රජු යාපහුව රාජධානියේ දේශපාලන කටයුතු මෙහෙයවූ ආකාරය මූලාශ්‍රය ඇසුරින් විග්‍රහකර ඇත. තවද මෙම රජු මධ්‍ය ආසියානු රාජ්‍ය හා ඇතැම් අප්‍රිකානු මහාද්වීපික රාජ්‍ය

---

[1] Liyanagamage, Amaradasa., *The Decline of Polonnaruwa and the Rise of Dambadeniya (circa 1180-1270 A.D).*, (D.P.R.D) Government Press, Colombo,1968

[2] ලියනගමගේ අමරදාස., *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය*, (ම.කා.ලං.ඉති) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1989

[3] Gunasinghe, P.A.T., *The Political History of Kingdom of Yapahuwa- Kurunegela and Gampola (1270-1400),* Lake House Printers & Publishers Ltd, Colombo,1987

සමඟ පැවැත්වූ වාණිජ සම්බන්ධතා පිළිබඳ තොරතුරු නොයෙක් විදේශ වාර්තා මඟින් සනාථ කර තිබේ. එමඟින් මෙම රජු විදේශ රාජ්‍යයන් සමඟ පවත්වාගෙන ගිය වාණිජ ප්‍රතිපත්තිය කෙබඳු ආකාරයක් ගනු ලැබුවේ ද යන්න හෙළි කෙරේ. සමකාලීන දේශපාලන ඉතිහාසය විමසීමේ දී තවත් වැදගත් ලක්ෂණයක් වන යාපන අර්ධද්වීපයේ පාලන බලය හිමිකරගත් ආර්ය චක්‍රවර්තී පෙළපත පිළිබඳ තොරතුරු ද මෙම කෘතියේ තවත් පරිච්ඡේදයක සාකච්ඡාකොට ඇත. මීට අමතරව ලංකාවේ දේශපාලන බලය හිමිකර ගත් දකුණු ඉන්දියානු පෙළපතක් වූ අලගක්කෝණාරවරුන් හා ඔවුන් විසින් ගම්පොළ රාජධානි සමයේ දී හිමිකරගත් දේශපාලන අධිකාරිය පිළිබඳව ද වැඩි විග්‍රහයක යෙදේ.

සමකාලීන දේශපාලන තොරතුරුවලට අමතරව මෙම නිබන්ධයේ දී ක්‍රි.ව 1270 සිට ක්‍රි.ව 1400 දක්වා සියවස් දෙකකට ආසන්න කාලවකවානුවක් තුළ ලංකාවේ ආර්ථිකයේ සිදුවූ විපර්සාස හා නව ප්‍රවණතා පිළිබඳ සාකච්ඡා කිරීම ද වැදගත් ලක්ෂණයකි. ඉන්දියාව ප්‍රධාන මාලදිවයින ආදි දකුණු ඉන්දියානු රාජ්‍ය හා පර්සියාව ප්‍රධාන මධ්‍ය ආසියාතික රාජ්‍යය සමඟත්, චීනය ප්‍රධාන නැගෙනහිර ආසියානු රාජ්‍ය සමඟත් ලංකාව විදේශ වෙළඳාමේ යෙදීම පිළිබඳ ප්‍රමාණාත්මක විග්‍රහයක් මෙහිදී සිදුකර ඇත. මෙම පර්යේෂණය තුළින් යාපහුව, කුරුණෑගල හා ගම්පොළ යන රාජ්‍යයන්හි අභ්‍යන්තර දේශපාලන තත්ත්වය හා සමකාලීන ආර්ථික ඉතිහාසය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක යෙදී ඇති බව පැහැදිලි ය. එහෙත් අපගේ අධ්‍යයනයෙන් විමසා බැලීමට අපේක්ෂිත ක්‍රි.ව 13-15 වැනි සියවස් අතර කාලයේ මෙරට විදේශ සම්බන්ධතා පිළිබඳ පූර්ණ අධ්‍යයනයක අවශ්‍යතාව එමඟින් පිරිමැසී නැත.

විවිධ විශ්වවිද්‍යාලවල පශ්චාද් උපාධි අවශ්‍යතා සඳහා ඉදිරිපත් කෙරුණු ඉහත සඳහන් පර්යේෂණ නිබන්ධ හැරුණු විට මෙම කාලපරිච්ඡේදය පිළිබඳ අවධානය යොමු කරමින් උසස් මට්ටමේ ශාස්ත්‍රීය කෘති රැසක් මේ වන විටත් මුද්‍රණද්වාරයෙන් එළිදක්වා තිබේ. ඒ අතර **ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය, පළමු කාණ්ඩය, දෙවන භාගය**[4] වැදගත් කෘතියකි. පොළොන්නරුව රාජධානිය බිඳවැටීමෙන් අනතුරුව දඹදෙණියේ ආරම්භ වූ නව සිංහල රාජධානිය හා නව රජ පෙළපත පිළිබඳ සෙනරත් පරණවිතාන විසින් සපයන ලද සාර ගර්භ ලිපියක් එහි ඇතුළත් වේ. එසේම දඹදෙණි රාජ්‍ය සමයේ දී එල්ල වූ චන්ද්‍රභානු නම් ජාවක රජුගේ ආක්‍රමණ පිළිබඳව හා ආර්ය චක්‍රවර්තීන් විසින් යාපනයේ පාලන බලය මෙහෙයවීම සම්බන්ධයෙන් ද එහි විස්තර කර තිබේ. ඒ අනුව සමකාලීන අග්නිදිග ආසියාතික රාජ්‍ය හා දකුණු ඉන්දියානු රාජ්‍ය සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ සංක්ෂිප්ත සමාලෝචනයක් එම ලිපියෙහි අන්තර්ගත වේ. මීට අමතරව දඹදෙණි රාජ්‍ය පෙළපත පරිහානියට පත්වීම හා ගම්පොළ රාජ්‍ය සමයේ දේශපාලන අධිකාරිය හිමිකර ගත් සේනාධිලංකාර හා අලගක්කෝණාර පෙළපත් පිළිබඳව ද විස්තරයක් සපයා ඇත. මේ අනුව සමස්තයක් වශයෙන් සලකා බලන විට ක්‍රි.ව 1215 සිට ක්‍රිව 1410 දක්වා ලංකා ඉතිහාසයේ දේශපාලන තොරතුරු හැදෑරීමට පාදක කරගත හැකි පුරෝගාමී ශාස්ත්‍රීය කෘතියක් වශයෙන් මෙම කෘතිය වැදගත් වේ. එහෙත් ප්‍රස්තුත

[4] *ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය*, පළමු කාණ්ඩය, දෙවැනි භාගය, සංස්: සෙනරත් පරණවිතාන, සී.ඩබ්. නිකලස් ආටිගල, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැළණිය, 1972, 581-622 පිටු (ලං.වි.ලං.ඉති)

අධ්‍යයනය තුළ සාකච්ඡාවීමට නියමිත පෙර අපරදෙදිග සමකාලීන විදේශ සම්බන්ධතා කෙරෙහි මෙහිදී වැඩි අවධානයක් යොමුවී නැති සදහන් කළ යුතුය.

මහාචාර්ය මැන්දිස් රෝහණදීර සිය ආචාර්ය උපාධිය සඳහා වර්ෂ 1970දී ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ මහාසාමි සංඝරාජ පදවිය හා තදානුබද්ධ සංඝ සංවිධානයේ ඉතිහාසය නැමති පර්යේෂණය කෘතිය තුළ අන්තර්ගත නොවූ තොරතුරු ඉදිරිපත් කිරීමටත්, පර්යේෂණයේ දී සාකච්ඡා වූ බොහෝ කරුණු තවදුරටත් සනාථ කිරීමත් සඳහා වර්ෂ 2001 දී **බුදු සමය නිරිතදිග**[5] නම් කෘතිය එළිදක්වා ඇත. ක්‍රි.ව 12-16 වන සියවස් අතර කාලයේ ලංකාවේ ආගමික ඉතිහාසය පිළිබඳ විමසා බැලීමක් මෙම කෘතිය මගින් සිදුවී තිබේ. නිරිතදිග ප්‍රදේශයේ ආරම්භ වූ මෙම නව රාජ්‍යයන්හි පාලකයින් බෞද්ධාගම ආරක්ෂා කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හා ශාසනික අභිවෘද්ධිය උදෙසා කටයුතු කළ ආකාරය මෙම කෘතියේ දී සාකච්ඡාවට ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ථෙරවාදි බුදු සසුන අග්නිදිග ආසියාතික රාජ්‍ය දක්වා පැතිරීම පොළොන්නරුව රාජධානිය අගභාගයේ සිට සිදුවිණැයි සාමාන්‍ය පිළිගැනීම වුවත් මෙම කෘතියේ දී රෝහණදීන් එම ක්‍රියාවලිය සිදුවන්නේ නිරිතදිග රාජධානි සමයේ දී යැයි සාක්ෂ්‍ය මගින් තහවුරු කර තිබේ. බුරුමය, තායිලන්තය, කාම්බෝජය, ලාඕසය වැනි අග්නිදිග ආසියාතික රටවල ථෙරවාදි බෞද්ධ සම්ප්‍රදාය ස්ථාපිතවීමත් ලාංකීය සම්ප්‍රදායට අනුගත ශාසනික අභිවෘද්ධිය ඇතිවීමත් පිළිබඳ මෙහිදී දීර්ඝව විස්තර කර ඇත. ඒ අනුව අපගේ ප්‍රස්තුතයෙන් අධ්‍යයනය කිරීමට අපේක්ෂිත විදේශ රාජ්‍ය සමඟ පවත්වන ලද ආගමික සම්බන්ධතා පිළිබඳ තොරතුරු විග්‍රහයට ලක්ව ඇති නමුත් අග්නිදිග ආසියාතික රාජ්‍යයන් (බුරුමය හා සියම) සමඟ පැවති ආගමික සම්බන්ධතා හැරුණු කොට වෙනත් ආකාරයේ සබඳතා හෝ සමකාලීනව වෙනත් රාජ්‍යයන් සමඟ පැවැත්වූ විදේශ සම්බන්ධතා පිළිබඳ එහිදී අවධානය යොමුව නැති බව සදහන් කළ යුතුය.

ඉහත සදහන් විග්‍රහයන් තුළින් මෙම කාලපරිච්ඡේදයට අදාළව වෙනත් මාතෘකා යටතේ සිදුකරන ලද පර්යේෂණවලදී විදේශ සම්බන්ධතා පිළිබඳ ද යම් අවධානයක් යොමුව ඇති බව පැහැදිලි වේ. එහෙත් එම අධ්‍යයනයන් එක් විදේශ රාජ්‍යයකට පමණක් හෝ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික යන විෂය ක්ෂේත්‍ර අතරින් එක් අංශයකට පමණක් හෝ සීමාවී ඇති ඒවා බව පෙනේ. ඉහත සදහන් කළ පර්යේෂණ හා ශාස්ත්‍රීය කෘති හැරුණුවිට මෙම කාල වකවානුව පිළිබද අවධානය යොමු කරමින් රචිත තවත් කෘති කිහිපයක් තිබේ.

ක්‍රි.ව 13-15සියවස් අතර කාලපරිච්ඡේදයේ ලංකාව විදේශ රටවල් සමඟ ආගමික සම්බන්ධතා පිළිබඳව ද පර්යේෂණ සිදුකර ඇත. වර්ෂ 1980 දී මූර්ති[6] විසින් ශාස්ත්‍රපති (MA) උපාධි පර්යේෂණ නිබන්ධයක් වශයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට **ක්‍රි.ව 11 වන ශතවර්ෂයේ සිට ක්‍රි.ව 19 වැනි ශතවර්ෂය දක්වා ශ්‍රී**

[5] රෝහණදීර මැන්දිස්., *බුදුසමය නිරිතදිග*, (බු.ස.නි) තරංජී ප්‍රින්ටර්ස්, නාවින්න, 2001

[6] මොහුගේ කෘතියේ පෙළපත් නාම හෝ වාසගම පිළිබද කිසිදු සදහනක් නොවන බව සදහන් කළ යුතුය.

**ලංකාව හා බුරුමය අතර පැවති සංස්කෘතික සම්බන්ධතා** යන මාතෘකව යටතේ ඉදිරිපත් කළ කෘතිය වර්ෂ 2005 දී **ලංකාව හා බුරුමය**[7] යනුවෙන් මුද්‍රණ ද්වාරයෙන් එළිදැක්විණි. මෙම පර්යේෂණය අග්නිදිග ආසියාතික රාජ්‍යයක් වූ බුරුමය හා ලංකාව අතර පැවැති සංස්කෘතික හා ආගමික සම්බන්ධතා පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ ශාස්ත්‍රීය කෘතියකි. මෙම පර්යේෂණයෙන් තහවුරු වන ආකාරයට දෙරට අතර එකිනෙකට වෙනස් භූගෝලීය පසුබිමක් හා ජාතීන් වශයෙන් එකිනෙකට වෙනස් ජනකොට්ඨාස පැවතිය ද දෙරට අතර සම්බන්ධතා පැවැත්වීමේ දී පදනම වූයේ ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදාය අනුගමනය කිරීම දෙරටක් වශයෙන් පැවති සමීප බැඳීම ය. මෙම පර්යේෂණයේ තවත් විශේෂතාවයක් වන්නේ ලංකාව හා බුරුමය අතර පැවති ආගමික සම්බන්ධතා කාලානුරූපී විශේෂතා සහිතව අධ්‍යයනය කිරීම ය. මූර්තිගේ එකී කෘතියේ ලංකාව හා බුරුම සමඟ පැවති ආගමික හා සංස්කෘතික සම්බන්ධතා විග්‍රහකර ඇති නමුත් සෙසු ආසියාතික රාජ්‍යයන් සමඟ හෝ වෙනත් විදේශ රටවල් සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ විග්‍රයක් ඉදිරිපත් කර නැත.

විවිධ විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අවශ්‍යතා සඳහා ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් පර්යේෂණ නිබන්ධන හැරුණු කොට ප්‍රස්තුත මාතෘකාවට අදාළ කාලපර්ච්ඡේදයට අදාළව තවත් ග්‍රන්ථ කිහිපයක් තිබේ. ඒ අතර මහාචාර්ය සෙනරත් පරණවිතාන සම්පාදිත **Ceylon and Malaysia**[8] නම් පර්යේෂණ කෘතිය විශේෂයෙන් සඳහන් කළයුතු වේ. දඹදෙණි රාජධානි සමයේ සිට ලංකාව අග්නිදිග ආසියාතික රාජ්‍යයන් සමඟ ආරම්භ කළ නව සම්බන්ධතා ජාලය පිළිබඳ මෙම කෘතියේ දී අවධානය යොමු කෙරේ. මෙම පර්යේෂණ කෘතිය මෙතෙක් අග්නිදිග ආසියාතික රාජ්‍ය සමඟ ලංකාව ගොඩනගාගත් විවිධාකාරයේ සම්බන්ධතා පිළිබඳ සිදුකරන ලද වෙනත් ඓතිහාසික විග්‍රහයන්ට වඩා නව මඟක් ගත් ග්‍රන්ථයකි. එනම් මහාචාර්ය පරණවිතාන පමණක් මෙතෙක් කියවා ඇති වෙනත් කිසිදු දෙස් විදෙස් අභිලේඛනඥයෙකු විසින් කියවා අර්ථගන්වා නොමැති අන්තරාලීන සෙල්ලිපි මෙම පර්යේෂණයට පාදක කර ගෙන තිබේ. අන්තරාලීන ශිලාලිපි ඇසුරින් පරණවිතාන විසින් රචනා කරන ලද **Ceylon and Malaysia, The story of Sigiri, The Greek and the Mauryas** යන කෘති තුන ලෝක විද්වතුන්ගේ වැඩි අවධානයට ලක්ව නැති අතර අන්තරාලීන ශිලාලිපි යන සංකල්පය පිළිබඳව ද සමකාලීන උගතුන්ගේ දැඩි විවේචන එල්ල වී තිබේ.[9]

වර්ෂ 1995 දී ප්‍රකාශයට පත් කෙරුණු එස්.ජී.එම්. වීරසිංහ ගේ **A History of the Cultural Relations Between Sri Lanka and China**[10] නම් කෘතිය ලංකාව හා චීනය අතර පැවති සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ විග්‍රහ කෙරෙන තවත් වැදගත් ග්‍රන්ථයකි. අතීතයේ පටන් ලංකාව ප්‍රධාන ගොඩබිම් මාර්ගයක් වන *සේද මාවත* හරහා ග්‍රීක, රෝම, පර්සියානු, අරාබි හා චීන යන ජාතිකයින් අතර

[7] මූර්ති., *ලංකාව සහ බුරුමය*, (ලං.බු) මියුරෝ පොත් ප්‍රකාශන, 2005

[8] Paranavithana Senarath., *Ceylon and Malaysia*, Lake House Printers and Publishers Ltd,Colombo, 1966

[9] Guruge W.P. Ananda., Senarath paranavithana As A Writer of Historic fiction in Sanskrit, Vidyodaya Journal of Social Sciences, Vol 7 , 1&2, 1996, USJP.,1996,157-179pp

[10] Weerasinghe S.G.M., *A History of the Cultural Relation Between Sri Lanka and China*, The Central Cultural Fund, Colombo, 1995

අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධතා පැවැත්වූ ආකාරය එමගින් විග්‍රහයට ලක් කෙරේ. විශේෂයෙන් චීනය හා ලංකාව අතර පැවති සංස්කෘතික සම්බන්ධතා කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් එම සබඳතා පැවැත්වූ ආකාරය මෙහි පෙන්වා දී ඇත. එහෙත් මූලාශ්‍රය මැනවින් හඳුනාගෙන දෙරට අතර පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ සිදුකළ ගැඹුරින් අධ්‍යයනයක් ලෙසින් මෙය සැලකිය නොහැක.

පර්යේෂණ ග්‍රන්ථ වශයෙන් ඉදිරිපත්ව ඇති ඉහත සඳහන් කෘති හැරුණු විට විද්වතුන් විසින් වරින් වර *මෙම විෂය ක්ෂේත්‍රය අළලා ප්‍රකාශයට පත්කළ පර්යේෂණ ලිපි විශාල ප්‍රමාණයක්* ඇත. මෙහිදී ඒවායින් කිහිපයක් පිළිබඳ අවධානය යොමු කෙරේ. ප්‍රස්තුතයට අනුගතව රචිත මෙම පර්යේෂණ ලිපි ද තේමාවන් කිහිපයක් යටතේ විග්‍රහකර බැලිය හැකිය. ඒ අතරින් *ලංකාව හා දකුණු ආසියාතික රාජ්‍ය අතර පැවති සම්බන්ධතා* පිළිබඳ තොරතුරු සාකච්ඡා කරමින් ඉදිරිපත් වී ඇති ලිපි කිහිපයකි. රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛා සඟරාවට එච්.ඩබ්.කොඩ්රින්ටන් විසින් සපයන ලද **Vijayanagar and Ceylon**[11] නැමති ලිපියෙන් කෝට්ටේ හයවැනි පරාක්‍රමබාහු රජු හා දකුණු ඉන්දියාවේ විජයනගර් අධිරාජ්‍ය අතර පැවති දේශපාලන සම්බන්ධතා විස්තර කර ඇත. තවද එතුමා ගේ පර්යේෂණ ලිපියක් වන **Conar and Alagakkonar**[12] නම් ලිපිය ගම්පොළ රාජධානි සමයේ දී ලංකාවට පැමිණි කේරළ සම්භවයක් සහිත ප්‍රභූරාජ අලකේශ්වර හා ඔහුගේ පෙළපත පිළිබඳ අවධානය යොමු කරමින් සම්පාදනය වී ඇත. මෙම ලිපියේ ඉදිරිපත් වන බොහෝ තොරතුරු ලංකාව හා සමකාලීන දකුණු ඉන්දියානු රාජ්‍ය අතර පැවති සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා උපකාරී වේ.

Kalyani Journal of Humanities & Social Sciences of the University of Kelaniya නම් ශාස්ත්‍රීය සඟරාවේ ද අපගේ ප්‍රස්තුතයට සෘජුව හා වක්‍රව සම්බන්ධ ලිපි පෙළක් පළවී ඇති බව අධ්‍යයනයන් තුළින් හෙළි විය. අමරදාස ලියනගමගේ රචනා කරන ලද **Keralas in Medieval Sri Lankan History: A Study of Two Contrasting Roles**[13] නම් ලිපිය මධ්‍ය කාලීන අවධියේ ලංකාවේ පාලන බලය හිමිකර ගත් කේරළවරු පිළිබඳ දීර්ඝව සාකච්ඡා කරන ලද පර්යේෂණ ලිපියකි. එහිදී පෙර සඳහන් කරන ලද කොඩ්රින්ටන් මහතා ගේ **Conar and Alagakkonar** නම් ලිපියේ දැක්වෙන අදහස් ප්‍රමාණය කර ඇත. ඉහත සඳහන් කරන ලද දේශපාලන සම්බන්ධතා හැරුණු කොට ඉන්දියාව සමඟ පැවති ආගමික සම්බන්ධතා විග්‍රහ කරමින් ඉදිරිපත් වූ ලිපියක් වශයෙන් S. Pathmanathan ගේ **Buddhism and Hinduisum in Sri Lanka: Some Points of Contact Between Two Religious Traditions, cira A.D. 1300-1600**[14] ලිපිය සැලකිය හැකිය. බෞද්ධාගම හා හින්දු ආගම අතර පැවති

---

[11] Codrinton H.W., *Vijayanagar and Ceylon*, Journal of Royal Asiatic Society, N&Q xxvi,70,1917,101-104pp (JRAS)

[12] Codrinton H.W., *Conar and Alagakkonar* ,JRAS xxix, I-IV,75,1923,106-107pp

[13] Liyanagamage A., *Keralas in Medieval Sri Lankan History: A Study of Two Contrasting Roles*, Kalyani Journal of Humanities & Social Sciences of the University of Kelaniya, Vol V & VI, 1986-1987,61-77pp (KJHSS)

[14] Pathmanathan S., *Buddhism and Hinduisum in Sri Lanka: Some Points of Contact Between Two Religious Traditions, cira A.D. 1300-1600*, KJHSS, Vol V & VI, 1986-1987,78-112pp

විශේෂතා හා මුලික ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් රචිත මෙම ලිපිය ලංකාව හා ඉන්දියාව අතර පැවති ආගමික සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය කිරීමට හැකිවන ආකාරයට රචනා කර තිබේ.

මීට අමතරව *ලංකාව හා අග්නිදිග ආසියාතික රාජ්‍ය අතර* පැවැති සම්බන්ධතා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමින් ද ලිපි සම්පාදිත ය. මහාචාර්ය පරණවිතාන විසින් රචනා කරන ලද ඉහත දී අප සාකච්ඡාවට ගත් **Ceylon and Malaysia** නම් කෘතිය පිළිබඳ නව අදහස් හා යෝජනා හා විවේචන ඉදිරිපත් කරමින් කේ.ඩබ්. ගුණවර්ධන විසින් **Comment on Ceylon and Malaysia in Middlevel Times**[15] නම් ලිපිය රචනා කර ඇත. මෙම ලිපිය තවදුරටත් ලංකාව හා මලය අර්ධද්වීපය අතර පැවති සබඳතා පිළිබඳ නව අදහස් ඉදිරිපත් කිරිමකි. මීට අමතරව විද්‍යෝදය සමාජීය විද්‍යා සංග්‍රහයේ කිහිප අවස්ථාවක අපගේ ප්‍රස්තුතයට අදාළව ලංකාව හා අග්නිදිග ආසියාතික රාජ්‍ය සමඟ පැවති සම්බන්ධතා පිළිබඳ අවධානය යොමු කරමින් ලිපි පෙළක් පළ වී ඇත. එහි පළවු මහාචාර්ය මැන්දිස් රෝහණදීර ගේ **Telakatahagatha in A Thailand Inscriftion of 761 A.D. (New Evidence on Cultural Relations between Sri Lanka and the Dvaravathi Kingdom in Thailand)**[16] නම් ලිපිය මඟින් ලංකාව හා තායිලන්තයේ පැරණි දොවාරවතී රාජ්‍ය අතර පැවති සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ තොරතුරු හෙළිකර ඇත. එතුමා මෙම ලිපියේ දිගුවක් වශයෙන් ඉතිරි කොටස 1988 විද්‍යෝදය සඟරාව සඳහා නැවත ඉදිරිපත් කර තිබේ.[17] මෙම සම්බන්ධතා පිළිබඳ තවදුරටත් විග්‍රහ කරමින් එතුමා නැවත වරක් තායිලන්තය හා ලංකාව අතර පැවති සම්බන්ධතා පිළිබඳ ලිපියක් පළකර ඇත. එනම් **Interpretation of Sources Material for the Study of relation between Sri Lanka and Thailand Prior to Fourteenth Century**[18] යන මාතෘකාව යටතේ එම ලිපිය සම්පාදනය කර තිබේ. මෙහි තායිලන්තය හා ලංකාව අතර පැවති සියලු ආකාරයේ සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා යොදා ගත හැකි මුලාශ්‍රය පිළිබඳ සාර්ථක විවරණයක් සපයා ඇත.

තවත් අග්නිදිග ආසියාතික රාජ්‍යයක් වශයෙන් මියන්මාරය සමඟ ලංකාව අතර පැවති සම්බන්ධතා විග්‍රහ කොට මෑත කාලයේ JRAS සඟරාවේ පළවු ලිපියක් වශයෙන් හේමා ගුණතිලක විසින් රචිත **Sri Lanka-Myanmar Historical Relation in Religion, Culture and Polity** [19] ලිපිය හැඳින්විය හැකිය. මෙම ලිපියෙන් ලංකාව හා මියන්මාර රාජ්‍ය අතර පැවැති දේශපාලන, ආගමික හා සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ වැදගත් තොරතුරු ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත.

---

15 Gunawardene K.W., *Comment on Ceylon and Malaysia in Middlevel Times*, JRAS N.S. VII, 1961,256-262pp

16 Rohanadeera M., *Telakatahagatha in A Thailand Inscriftion of 761 A.D. (New Evidence on Cultural Relations between Sri Lanka and the Dvaravathi Kingdom in Thailand),* Vidyodaya Journal of Social Science, 1/1, January, 1987,59-73pp (VJSS)

17 Rohanadeera M., VJSS, 2/1&2,January-July, 1988,47-63pp

18 Rohanadeera M., *Interpretation of Sources Material for the Study of relation between Sri Lanka and Thailand Prior to Fourteenth Century*, VJSS, Vol.5,1&2, 1991,1-16pp

19 Goonathilake H., *Sri Lanka-Myanmar Historical Relation in Religion, Culture and Polity*, JRAS (N.S), LV, 2010, 77-114pp

*නැගෙනහිර ආසියාතික රාජ්‍යයක්* වශයෙන් චීනය සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා සාකච්ඡා කරමින් පළවූ පර්යේෂණාත්මක ලිපියක් වශයෙන් පී. අරුණාචලම් විසින් රචිත **Political relation of Ceylon with China During the Middle age** [20] නම් ලිපිය හඳුනාගත හැකිය. මෙම ලිපිය කෙටි ලිපියක් වුවත් චීනය හා ලංකාව අතර පැවති දේශපාලන සම්බන්ධතා පිළිබඳ අවධානය යොමු කළ මුල්ම පර්යේෂණාත්මක ලිපියක් ලෙසින් හඳුන්වාදිය හැකිය. මේ හැර *බටහිර ආසියාතික හා අප්‍රිකානු රාජ්‍ය සමග* පැවති සම්බන්ධතා පිළිබඳ කොඩ්රින්ටන් විසින් රචිත **A Sinhala Embassy to Egypt** [21] නැමති ලිපියෙන් අනාවරණය වේ. එහි යාපහුව රාජධානි සමයේ පළමු වැනි බුවනෙකබාහු රජු හා මිසරය රාජ්‍ය අතර පැවති වාණිජ සම්බන්ධතා විමර්ශනය කර ඇත.

පොළොන්නරුව රාජධානිය බිඳවැටීමේ සිට කෝට්ටේ රාජධානි ආරම්භය දක්වා ලංකාව පැවැත්වූ විදේශ සම්බන්ධතා යනුවෙන් සිදු කෙරන මෙම අධ්‍යයනයේ දී සමකාලීනව මෙරට විදේශ සබඳතා පුළුල් විග්‍රහයකට ලක් කිරීම පහසු වන අන්දමින් මෙහි පරිච්ඡේද ව්‍යුහය සකස් කර ගැණිනි. ලංකාවේ විදේශ සබඳතා පිළිබද මෙතෙක් සිදුකර ඇති අධ්‍යයනයන් බොහෝමයක දී එක් එක් රටවල් පදනම් කර ගනිමින් ඒ ඒ රටවල් හා ලංකාව අතර පැවති සබඳතා අධ්‍යයනය කිරීමට උත්සාහ දරා ඇති බව පැහැදිලි වේ. එහෙත් විදේශ සදබදා විග්‍රහ කෙරෙන නූතන සංකල්ප සමඟ සසඳන විට ලංකාව විදේශ සබඳතා පැවත්වූ කලාප වශයෙන් සැලකිල්ලට ගෙන දත්ත විශ්ලේෂණය කිරීමෙන් වඩාත් පුළුල් විග්‍රහයක් සිදුකළ හැකි බව පෙනී ගියේ ය. මේ නිසා අදාළ කාලපරිච්ඡේදයේ විදේශ සම්බනධතා පැවැත්වූ විවිධ කලාප පදනම් කර ගනිමින් මෙම අධ්‍යයනයේ පරිච්ඡේද ව්‍යුහය සකස් විණි. ඒ අනුව මෙම අධ්‍යයනය වඩාත් සවිස්තරව පුර්ණ එකක් වශයෙන් සිදුකිරීමට ලංකාව කේන්ද්‍රකර ගනිමින් නූතන ලෝක සිතියමේ දැක්වෙන මහාද්වීපික කලාප පදනම්කර එකී ප්‍රදේශ සමඟ මෙරට පැවැත්වූ විදේශ සම්බන්ධතා අධ්‍යයනය කිරීම සඳහා යොමුවිය.

මෙම පර්යේෂණයේ දී පළමු වැනිපරිච්ඡේදය මාතෘකාව පිළිබද සුදුසු අර්ථ කථනයක් සපයා ගැනීමට හා පර්යේසණයේ දී යොදා ගැනෙන මුලාශ්‍රය පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කිරීමට නේ කෙරිණි. ඒ අනුව පළමු පරිච්ඡේදයේ දී විදේශ සම්බන්ධතා යන සංකල්පය නූතන හා පැරණි අධ්‍යයන ප්‍රවේශ යටතේ ප්‍රමාණාත්මකව විග්‍රහ කර ගැනීමෙන් පසුව ප්‍රස්තුත කාලවකවානුව තුළ ලංකාව වෙනත් රාජ්‍ය සමඟ පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ තොරතුරු හෙළිවන ප්‍රාථමික මුලාශ්‍රය පිළිබඳ අවධානය යොමුකර ඇත. එහිදී දේශීය හා විදේශීය වශයෙන් තොරතුරු හෙළිවන සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මුලාශ්‍රය කිහිපයක් කෙරෙහි විමර්ශනාක්ෂිය යොමු විය. ඊට අමතරව මෙම පරිච්ඡේදය අවසානයේ දී අදාළ කාලවකවානු පිළිබඳ අධ්‍යයනයට ප්‍රථමයෙන් රජරට ශිෂ්ටාචාර සමයේ ලංකාව හා වෙනත් රාජ්‍යයන් අතර පැවති සම්බන්ධතාවල ස්වරූපය අවබෝධකර ගැනීම වැදගත් වන නිසා රජරට ශිෂ්ටාචාර සමයේ විදේශ රාජ්‍යයන් සමඟ පැවැත්වූ සම්බන්ධතා පිළිබදව සංක්ෂිප්ත විග්‍රහයක් සිදු කෙරිණි.

---

[20] Arunachalam P., *Political relation of Ceylon with China During the Middle age*, JRAS, XXII,67,1914,124-125pp
[21] Codrinton H.W., *A Sinhala Embassy to Egypt*, JRAS, N&Q, XXVII,I-IV, 72,1919,82-85pp

දෙවැනි පරිච්ඡේදය ආරම්භයේ දී ක්‍රි.ව 13-15 සියවස් අතර ලංකාවේ සිංහල රාජධානි මායා රට තුළ පැතිරයාමේ පසුබිම පිළිබඳ අවධානය යොමු විය. එහිදී රජරට ශිෂ්ටාචාරය පරිහානියට පත්වීමේ පසුබිම හා නිරිතදිග ප්‍රදේශයේ සිංහල රාජධානි ආරම්භවීම පිළිවෙළින් සිදුවූ දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ හා කෝට්ටේ යන රාජධානි ආශ්‍රයෙන් මෙරට දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික හා සංස්කෘතික තත්ත්වයන් පිළිබඳ සැකවින් විමර්ශනය කෙරිණි. එමගින් අදාළ කාලපරිච්ඡේදය තුළ ලංකාවේ විදේශ සම්බන්ධතා කෙරෙහි බලපෑ සමකාලීන දේශපාලන තත්ත්වය මෙන්ම මෙරට රාජධානිවල ස්වභාවය ද සැලකිල්ලට භාජනය කෙරිණි.

තුන්වැනි පරිච්ඡේදය දකුණු ආසියාතික රාජ්‍ය සමග ලංකාව පැවැත්වූ සබඳතා විග්‍රහ කිරීම සඳහා වෙන් කෙරිණි. මෙම පරිච්ඡේදය ලංකාවට ඉතා ආසන්න මහාද්වීපය වන ආසියානු මහාද්වීපයේ වඩාත් සමීප රාජවංශ සමඟ පැවැත්වූ සබඳතා සලකා බැලිණි. එවකට ඉන්දියානු උපමහාද්වීපයේ ක්‍රියාත්මක වූ ප්‍රධාන රාජවංශ සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා අධ්‍යයනය කිරීම අපේක්ෂාව වේ. එනම් දකුණු ඉන්දියානු රාජවංශ ලෙස චෝළ, පාණ්ඩ්‍ය හා කේරළවරුන් ද උතුරු ඉන්දියානු රාජවංශ ලෙස රාජ්පුත්වරු සමඟ ලංකාව පැවැත්වූ සම්බන්ධතා දේශපාලන, ආර්ථික හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන් ඔස්සේ මෙම සාකච්ඡාව සිදු කෙරිණි.

මෙම අධ්‍යයනයේ සිව්වැනි පරිච්ඡේදය නැගෙනහිර ආසියාතික රාජ්‍යයන් හා අතීතයේ දී ලංකාව අතර පැවති සබඳතාවල ස්වරූපය අධ්‍යයනය කිරීමට වෙන්විය. නැගෙනහිර ආසියානු කලාපයේ පවතින නූතන රටවල් එකල බිහිවී නොතිබුණු බැවින් අතීතයේ එම ප්‍රදේශයේ ආධිපත්‍යය දරා සිටි චීනය හා ලංකාව අතර පැවති දේශපාලන, සමාජීය, ආර්ථික හා ආගමික සබඳතා පිළිබඳ පුළුල් අවධානයක් යොමුකර ඇත.

අදාළ කාලයේ දී අග්නිදිග ආසියාතික රාජ්‍යයන් සමග ලංකාව පැවත්වූ සබඳතා විග්‍රහ කිරීම සඳහා මෙහි පස්වැනි පරිච්ඡේදය වෙන්කර ඇත. එහිදී බුරුමය, ජාවා, කාම්බෝජය ආදි වූ මලය අර්ධද්වීපයේ රටවල් හා ලංකාව අතර පැවති විදේශ සබඳතා විමර්ශනයට ලක් කෙරිණි.

මෙම නිබන්ධයේ හයවැනි පරිච්ඡේදය අතීතයේ අප්‍රිකානු මහාද්වීපයේ රටවල් හා බටහිර මධ්‍ය ආසියාතික රාජ්‍යයන් සමග පැවැත්වූ සබඳතා විමර්ශනය කිරීමට වෙන් කෙරිණි. මෙම නිබන්ධයට විෂය වූ කාලයෙහි අපරදිග රාජ්‍යයන් හා ලංකාව අතර සබඳතා පිළිබඳ ලැබෙන තොරතුරු ප්‍රමාණය ඉතා සීමිත ය. එබැවින් සමකාලීනව අපරදිග රාජ්‍ය හා ලංකාව අතර පැවති සබඳතා පිළිබඳව ද හයවැනි පරිච්ඡේදයේ දී අවධානය යොමු විය.

එක් එක් පරිච්ඡේදවලදී මතුවූ කරුණු ඇසුරින් එළැඹිය හැකි නිගමනයන් ද සැලකිල්ලට ගෙන සිදුකළ සමාලෝචනයක් නිබන්ධය අවසානයට එක්කර ඇති අතර නිබන්ධයේ ඉදිරිපත් කරුණු තවදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා අවශ්‍ය වන ශිලාලිපි, සිතියම් හා ඡායාරූප එකතුවක් ද උපග්‍රන්ථය වශයෙන් යොදා ගෙන ඇත. මෙම පර්යේෂණයේ දී අවසානයේ දත්ත ලබා ගැනීමට යොදාගත් මූලාශ්‍රය හා

පරිශීලනය කෙරුණු විවිධ පර්යේෂණ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය වශයෙන් නිබන්ධය අවසානයේ යොදා තිබේ.

# කෙටි යෙදුම්

| | |
|---|---|
| අනු.යු | අනුරාධපුර යුගය |
| අල.යු. | අලකේශ්වර යුද්ධය |
| එළු.අ | එළු අත්තනගලු වංසය |
| උ.ජ | උපාසකජනාලංකාර |
| ක්‍රි.ව | ක්‍රිස්තු වර්ෂ |
| ක්‍රි.පු | ක්‍රිස්තු පූර්ව |
| ජිනකා. | ජිනකාලමාලිය |
| ද.ඉ.ඉ | දකුණු ඉන්දියානු ඉතිහාසය |
| දඹ.අ | දඹදෙණි අස්න |
| දඹ.අ.ක.සි | දඹදෙණි අස්න හා කදවුරු සිරිත |
| දළ.සි | දළදා සිරිත |
| නි.කා.සං. | නිකාය සංග්‍රහය |
| නිකා.සං.ශා | නිකාය සංග්‍රහ හෙවත් ශාසනාවතාරය |
| පුජා. | පුජාවලිය |
| ම.ව | මහාවංශය |
| ම.කා.ලං.ඉති | මධ්‍යකාලීන ලංකා ඉතිහාසය |
| මානා.සං | මානාවුලු සන්දේශය |
| යෝ.ගා | යෝගාර්ණවය |
| රාජා. | රාජාවලිය |
| රාජරත්නා. | රාජරත්නාකරය |
| ලං.වි.ලං.ඉති | ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය |
| වු.ස.ස | වුත්තමාලා සන්දේශ ශතකය |
| සං. | සන්දේශ කාව්‍ය |
| සං.ලං.ඉති. | සංක්ෂිප්ත ලංකා ඉතිහාසය |

| | |
|---|---|
| සද්ධ.රත්නා,. | සද්ධර්මරත්නාවලිය |
| ස.රත්නා. | සද්ධර්මරත්නාකරය |
| සිං.සා.ලි | සිංහල සාහිත්‍ය ලිපි |
| සිං.සා.ව. | සිංහල සාහිත්‍ය වංශය |
| හ.වි.ව | හත්ථවනගල්ල විහාරවංසය |

| | |
|---|---|
| A.C | Ancient Ceylon |
| A.M.C.A.I.O | Ancient and Medieval Commercial Activities in the Indian Ocean Testimony of Inscriptions and ceramic- sherds |
| A.P | Asian Panorama |
| A.R.I.E | Annual Reports on Indian Epigraphy |
| A.R.S.I.E | Annual Report on South Indian Epigraphy |
| A.S.C.A.R | The Archaeological Survey of Ceylon Annual Report |
| A.S.I.A.R | Archaeological Survey of Indian Annual Report |
| C.A.L.R | Ceylon Antiquary and Literary Registration |
| C.B | Ceylon Branch |
| C.H.J | The Ceylon Historical Journal |
| C.J.H | Ceylon Journal of Humanities |
| C.J.H.S.S | Ceylon Journal of Humanities and Social Sciences |
| C.S.C | Crystal Sand Chronical |
| E.I | Epigraphy of India |
| E.Z | Epigraphic Zeylanica |
| I.C | Inscription of Ceylon |
| J.R.A.S | Journal of Royal Asiatic Society |
| K.J.H.S.S | Kalyani Journal of Humanities & Social Sciences of the University of Kelaniya |

| | |
|---|---|
| N.S | New Series |
| P.H.Y.K.G | The Political History of Yapahuwa, Kurunegala and Gampola |
| R.A.S.C | Report on the Archaeological Survey of Ceylon |
| S.I.I | South Indian Inscription |
| S.L.J.H | The Sri Lanka Journal of the Humanities |
| S.L.J.H | The Sri Lanka Journal of The Humanities |
| S.L.S.R.S | Sri Lanka and the Silk Road of the Sea |
| T.C | The Cholas |
| T.C.I.O | Trade and Civilization in the Indian Ocean, An Economic History from the rise of Islam to 1750 |
| T.D.P.R.D | The Decline of Polnnaruwa and the rise of Dambadeniya |
| T.M.P | Travels of Marco Polo, |
| T.P.K | The Pandyan Kingdom |
| U.C.R | University of Ceylon review |
| V.S.S | Vidyodaya the Journal of Social Sciences |

# සමාලෝචනය

ශ්‍රී ලංකාව දූපතක් වශයෙන් පිහිටීමත් ඉන්දියානු උපමහාද්වීපයට දකුණින් පිහිටා තිබීමත් මෙන්ම පෙර අපරදෙදිග පැරණි වෙළඳ මාර්ගයේ මධ්‍යස්ථානයක් ලෙස පිහිටා තිබීමත් ආසියාවේ රටවල් සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්විය හැකි මධ්‍යස්ථානයක් ලෙස පැවතීමත් නිසා අනුරාධපුර මුල් භාගයේ සිටම විදේශ සබඳතා අංශයෙන් කැපී පෙනෙන තත්ත්වයක් ලබා තිබිණි. මුහුදු මාර්ග ඔස්සේ පැවති වෙළඳ සබඳතා මෙන්ම ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් ලංකාවට ලැබුණු ප්‍රසිද්ධියත් ඉන්දියාව හා ලංකාව අතර අතීතයේ සිට පැවති සංස්කෘතික සම්බන්ධතාවයත් මෙරට විදේශ සබඳතා කෙරෙහි තීරණාත්මක ලෙස බලපෑවේ ය. මෙම නිබන්ධයේ විෂය ක්ෂේත්‍රය වූයේ රජරට ශිෂ්ටාචාරය බිඳිවැටීමත් කෝට්ටේ රාජධානිය ආරම්භයත් අතර කාලපරිච්ඡේදයේ ලංකාවේ විදේශ සබඳතාවල ස්වරූපය ගැඹුරින් පිරික්සීම ය.

ලාංකීය ශිෂ්ටාචාරය පාදක කොටගත් ප්‍රධානතම සාධක දෙක නම් වාරි මූලික කෘෂිකර්මාන්තය ප්‍රධාන කරගත් අර්ථ ක්‍රමය හා ථෙරවාදී බෞද්ධ ශාසන සම්ප්‍රදායයි. මේ සාධක දෙකම බිහිවූයේ වියළි කලාපීය පරිසරයේ භෞතික හා දේශගුණික පරිස්ථිතීන් පාදක කොටගෙන ය. මෙකී වියළි කලාපයෙන් බැහැරව ක්‍රි.ව 13වැනි සියවස සිට ක්‍රියාත්මක වූ නව ශිෂ්ටාචාරය තුළ උක්ත සඳහන් කළ සාධක පැවතිය ද ඒවා වඩා අපමුඛව හා අභිමුඛව දැකිය හැක්කේ වියළි කලාපයේ සවිස්තරව විහිදී ගිය ශාසනික හා ශිෂ්ටාචාර ලක්ෂණ සමඟ ය. මේ අනුව ක්‍රි.ව 13 වැනි ශතවර්ෂය අවසන් වනවිට රටේ කේවල ආධිපත්‍යයේ අවසානය ද දැකගත හැකිවිය. යාපනය ඇතුළු කුඩා රාජධානි ගණනාවකට රට බෙදී වෙන්වී තිබිණි. පාලකවරු ඔවුන් ජීවත් වූ අනාරක්ෂිත ආකාරය පෙන්නුම් කරමින් දඹදෙණිය, යාපහුව, කුරුණෑගල හා ගම්පොළ වැනි ස්වාභාවික බලකොටු සොයා රාජධානිය රටේ තැනින් තැනට ගෙන ගියහ.

අනුරාධපුර රාජධානි අවධියේ සිට ලංකාව ඉන්දියාව ප්‍රමුඛ පෙරදිග රාජ්‍යයන් හා අපරදිග රාජ්‍ය ගණනාවක් සමඟ දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික සම්බන්ධතා බහුල වශයෙන් පවත්වන්නට යෙදිණි. නමුත් රාජධානි ක්‍රමයෙන් මායා රට දක්වා ව්‍යාප්තවීම තුළ නව භෞතික හා ස්වභාවික පසුබිමක ස්ථාපිතවීම නිසා පූර්වයේ පවත්වා ගෙන පැමිණි දේශීය හා විදේශීය ප්‍රතිපත්තීන් ද වෙනසකට භාජනය විය. රජරට ශිෂ්ටාචාර සමයේ ද පවත්වා ගෙනයනු ලැබූ විදේශ කටයුතු තත් කාලීන ලාංකීය ඉතිහාසය ගොඩනැගීම කෙරෙහි අදාළ වුවාටත් වඩා වැඩි ප්‍රවණතාවක් නිරිතදිග ප්‍රදේශයේ රාජධානි ව්‍යාප්ත ක්‍රිව.13-15 සියවස් අතර කාලයේ දී දක්නට ලැබේ.

ක්‍රි.පූ හයවැනි සියවස සිට ඉන්දියානු ජන කණ්ඩායම් විසින් ලංකාවේ ජනාවාසකරණය ආරම්භ කිරීමත් සමඟ මෙරට ආර්ය ශිෂ්ටාචාරයක ආරම්භය පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රය වාර්තා කරයි. ඉන්පසුව ක්‍රමයෙන් ලක්දිව පුරා ජනාවාස ව්‍යාප්තවීමෙන් අනතුරුව රජරට කේන්ද්‍ර කර ගනිමින් ප්‍රධාන පාලන මධ්‍යස්ථාන ප්‍රභවය විය. එකී මුල් අවධියේ සිටම විදේශ සම්බන්ධතා පැවැත්වීම සංක්‍රමණ හා ආක්‍රමණ වශයෙන් වරින් වර අවස්ථා ගණනාවක දී ක්‍රියාත්මක විය. ක්‍රි.ව 13-15 සියවස් අතර කාලපරිච්ඡේදය තුළද එලෙසින්ම සමකාලීන නැගී සිටි දකුණු ඉන්දියානු පාණ්ඩ්‍ය වංශිකයින් සමඟ ආක්‍රමණ ස්වරූපයේ

සම්බන්ධතා පවත්වාගෙන යන්නට යෙදුණි. වීර පාණ්ඩ්‍යගේ ලංකා ආක්‍රමණය දැක්වෙන කුඩුමියාමලෙයි ප්‍රශස්තිය හා සෙසු පාණ්ඩ්‍ය සෙල්ලිපි පරීක්ෂණයට භාජනය කිරීමේ දී පූර්වෝක්ත පාණ්ඩ්‍ය ආක්‍රමණය දිවයිනේ දේශපාලන කටයුතුවලට ඉතා ප්‍රබල ලෙස මැදිහත්වීමක් ලෙසින් මෙම අධ්‍යයනයෙන් අනාවරණය වේ. පරාක්‍රමාබහු රජුගේ කීර්තිය චෝළ, පාණ්ඩ්‍ය ආදි විදේශීය රටවල පැතිරි ගොස් තිබුණු බව වර්ණනා කරන වංශකතා මෙකී පාණ්ඩ්‍ය ආක්‍රමණ පිළිබඳ කිසිවක් වාර්තා කර නොතිබීම පුදුමයට කරුණකි. ලංකා ආක්‍රමණ පිළිබඳ පාණ්ඩ්‍ය සෙල්ලිපි වාර්තා අතිශෝක්තියට බරව ඇති නමුත් එම සිදුවීම්වල ඓතිහාසික පදනම පිළිබඳ විශාල සැකයක් තැබීමට එය රුකුල් නොවේ. මේ අනුව දෙවැනි පරාක්‍රමබාහු රජු පිළිබඳවත් එම කාලය පිළිබඳවත් වංශකතා ඉදිරිපත් කරන තොරතුරුවලට අමතවර පූර්වෝක්ත විදේශීය ඓතිහාසික සාක්ෂ්‍ය මගින් ද සන්සන්ධනාත්මක අධ්‍යයනයක් කළ හැකිය.

ලංකාව සමඟ පැවැත්වූ එකී සම්බන්ධතා හැරුණු කොට රජරට ශිෂ්ටාචාර අවධියට වඩා කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. ඒ අතරින් ආර්ථික කටයුතු සඳහා මෙරටට පැමිණි ඉන්දියානු වාණිජ ප්‍රජාව මෙරට ජන සමාජයට මුසුවී දේශීය නායකයින් අභිබවා ස්වකීය ආර්ථික හා දේශපාලන බලය පුළුල් කර ගැනීමට සමත්වීම ප්‍රධාන අවස්ථාවකි. අතීතයේ සිටම බොහෝ දුරට ඉන්දියානු සම්බන්ධතා දකුණු ඉන්දියානු භූගෝලීය කලාපයට සීමාවුවත් ක්‍රි.ව 13-15 සියවස් වනවිට එය උතුරු ඉන්දියානු රාජවංශ දක්වා ව්‍යාප්තවීම තවත් විශේෂතාවයකි. එසේම දේශපාලන මැදිහත්වීම්වලට අමතර ප්‍රස්තුත අවධියේ ඉන්දියාව සමඟ පැවැත්වූ සම්බන්ධතා වාණිජ ක්ෂේත්‍රයේ දී විශේෂ වනුයේ රජරට යටත් කරගෙන සිටි චෝළවරුන් ගේ ආර්ථික ප්‍රතිපත්තියේ අවශේෂ වශයෙන් මෙරට ක්‍රියාත්මක වූ විශාල වාණිජ කණ්ඩායම්වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙනි.

දේශපාලන අවුල් වියවුල් හේතු කොටගෙන පෙරදිග ධාන්‍යාගාරය වූ රජරට අත්හැර දැමීම නිසා ආර්ථික ශක්තිය පිරිහීයාම වැළැක්වීය නොහැකි විය. ශිෂ්ටාචාරයේ උච්චතම අවධියේ දී භාණ්ඩාගාරය තරවුයේ ඉඩම් බද්දෙනි. නමුත් මායා රටට පැමණීමෙන් පසු එකී ආර්ථික පදනම ඉවත් වූ බැවින් වෙනත් යැපීම් මාර්ග සෙවීමට පාලකයන්ට සිදු වුයේය. සිංහල රාජධානි ක්‍රි.ව 13වැනි සියවස මුල් භාගයේ දි නිරිතදිගට සංක්‍රමණය වූ මෙම වකවානුවේ ඉන්දියානු සාගරයේ වෙළඳ කටයුතු ද වැඩි දියුණු වෙමින් පැවතිණි. මෙතෙක් අරාබි මුහුදේ සිදුකෙරුණු නාවික කටයුතු අරාබි මුහුදේ සිට බෙංගාල බොක්ක දක්වා මාරු විය. ඒ සමඟම ලංකාවේ ඊසාන, නැගෙනහිර, ගිණිකොණ හා දකුණු දිශාවල පිහිටි වරායයන් වැදගත් තැනක් ඉසිලූහ. එනිසා ලාංකික පාලකයෝ ද ඒ ගැන වඩාත් උනන්දු විය. නිරිතදිගට පැමිණීමෙන් පසු සිංහල රාජධානියේ ආර්ථික පදනම මින් පෙර පැවති රජරට විශාල මිටියාවත් අතැර දැමීම සිදුවෙමින් ආර්ථික බිඳවැටීම නොවැලැක්විය හැකි විය. ඊට එකම පිළියම වුයේ ගිනිකොණදිග ආසියාවේ සරුසාර වෙළඳාම වූ නමුත් එය ඒ වනවිටත් දිවයිනේ වරායවල මනාව තහවුරු වී අභ්‍යන්තර වෙළඳාමට ද අතගසා සිටි මුස්ලීම්වරුන් සතුවී තිබිණි. මුස්ලීම්වරු සමඟ පැවති සාම්ප්‍රදායික මිත්‍ර සම්බන්ධකම් මේ අසීරු අවස්ථාවේ දී පිහිටට ආවේය. ලංකාවට තවත් වාසි වූ කරුණක් විය. එනම් ක්‍රි.ව 12වැනි ශතවර්ෂයේ සිට කුළුබඩු නිෂ්පාදනය හා අපනයනය මොලොක්කාවේ මුස්ලීම් වෙළඳුන්

විසින් වැඩි දියුණුකර තිබීම නිසා පෙරදිග හා අපරදිග රාජ්‍යයන් සමඟ සබඳතා වැඩි වශයෙන් පවත්වාගෙන යෑමට අවස්ථාව උදාවිය.

ලංකා ඉතිහාසය ගොඩනැංවීමේ දී ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානවල ප්‍රාදේශීය විතැන්වීම පැහැදිලි කිරීම සඳහා විද්වතුන් විසින් විවිධ හේතු සාධක ඉදිරිපත් කර තිබේ. ඒ අතරින් විදේශීය ආක්‍රමණ හා අභ්‍යන්තරික් දේශපාලන අර්බුද වැනි හේතු සාධක ප්‍රධාන වෙයි. මෙම හේතු සාධක කෙරෙහි බලපවත් වන ප්‍රධාන සාධකයක් ලෙස සමකාලීන ඉන්දියානු සාගරය කේන්ද්‍ර කොට ගනිමින් ඇතිවූ තරඟකාරී වාණිජ කටයුතු වර්ධනවීම පෙන්වාදිය හැකියි. ඒ අනුව ක්‍රි.ව 13-15 සියවස් අතර කාලයේ දී ලංකාවේ පරිපාලන හා ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාප්තිය ප්‍රාදේශීය වෙනස්වීමය ලක්වී ඇති බව පැහැදිලිව පිළිඹිබු වන කරුණකි. ප්‍රධාන ආදායම් මාර්ගයක් වශයෙන් ඉන්දියානු සාගරයේ එවකට වර්ධනය වෙමින් පැවති වාණිජ කලාප සමඟ අන්තර් ජාතික වශයෙන් වෙළඳ සම්බන්ධතා දියුණුකර ගැනීමට ලාංකීය පාලකයින් උත්සාහ කළ ආකාරයක් මෙම කාලපරිච්ඡේදය පුරාවට දක්නට ලැබේ. මෙම තත්ත්වයට මුහුණදීම සඳහා ලංකාවේ ආර්ථික හා පරිපාලන මධ්‍යස්ථාන ප්‍රාදේශීය වශයෙන් විතැන්වීම සිදුවිය. පෙර අපරදෙදිග සාගරික වෙරළබඩ වෙළඳ මාර්ගයේ ලංකාව කේන්ද්‍රස්ථානයක් ලෙස පිහිටීම නිසා වාණිජ සම්බන්ධතා පැවැත්වීමේ වාසිය උපරිම වශයෙන් මෙරටට හිමිවිය. ඉන්දියානු සාගරයේ නැගෙනහිර හා බටහිර අතර සිදුකළ වෙළඳ කටයුතුවලදී ලංකාව වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් මෙන්ම අන්තර් හුවමාරු මධ්‍යස්ථානයක් වශයෙන් ද යොදා ගැනීමට හැකිවී ඇත.

දෙවැනි පරාක්‍රමබාහු රජු සිංහාසනයට පත්වීමට බොහෝ කාලයකට පෙර මාඝ රජරට පාලකයා විය. මාඝ හැරුණු විට චන්ද්‍රභානු නැමති ජාවක රජ මලය අර්ධද්වීපයේ තාම්බ්‍රලිංග රාජ්‍යයේ සිට පරාක්‍රමබාහු රජ දවස දෙවරක් ලංකාව ආක්‍රමණය කළේය. එකී ජාවක ආක්‍රමණ දෙක පාලි වංශකතාවේ එන විස්තරයෙන් හැඟෙන්නේ සාර්ථක ලෙස මර්දනය කළ ආකාරයකි. එසේම ඒවා අහඹු ලෙස සිදුවූ කඩාවැදීම් ලෙස ද දැක්වේ. නමුත් චන්ද්‍රභානු රජරට සැලකියි යුතු ප්‍රදේශයක ස්වකීය ආධිපත්‍ය පිහිටුවා ගෙන දිවයිනේ නැවතී සිටි බවක් මෙම අධ්‍යයනය තුළින් අවබෝධ වේ. එය අග්නිදිග ආසියාතික රාජ්‍යයක් විසින් මෙරට ආක්‍රමණය කිරීමේ පළමු අවස්ථාව වශයෙන් සඳහන් වන ආකාරයටම මෙම ආක්‍රමණ අග්නිදිග ආසියාතික රාජ්‍යයන් සමඟ ලංකාව වෙනත් ආකාරයේ සම්බන්ධතා ආරම්භ කිරීම සඳහා ප්‍රවේශවීමක් ලෙස හැඳින්වුවාට ද වරදක් නොවේ.

ශ්‍රී ලංකාවේ ථෙරවාදී බුදු සසුන පිළිබඳ කීර්තිය නැගෙනහිර හා අග්නිදිග ආසියාතික රටවලට පැතිරයමින් පැවතියේ පොළොන්නරුව යුගය අවසාන භාගයේ සිට බව සාමාන්‍යයෙන් පිළිගෙන තිබේ. එහෙත් නිශ්චිත සාක්ෂ්‍ය විමසා බැලීමේ දී චීනය, බුරුමය, තායිලන්තය, කාම්බෝජය, ලාඕසය යන රටවල් හා ලංකාව අතර නිරන්තරයේ ඔබමොබ සංස්කෘතික හුවමාරු ගමන් බිමන් සිදුව ඇත්තේ නිරිතදිග තෙත් කලාපයේ බුදු සසුන තහවුරු වන වකවානුවේ සිට බව පෙනී ගොස් ඇත.

ලංකාව නැගෙනහිර හා අග්නිදිග ආසියාතික රාජ්‍යයන් අතර මිත්‍රතාවයට පදනම් වී ඇත්තේ මෙරට හා එකී කලාපීය රාජ්‍යයන් අතර ජාතික ආගම වූ ථෙරවාදී බුද්ධාගම බව පෙනීයන ප්‍රධාන කරුණකි.

යථෝක්ත කරුණු සාකච්ඡා කිරීමේදී මූලික වශයෙන් මෙම රටවල ආගමික ඉතිහාසය සහ ඊට බලපෑම් ඇතිකළ දේශපාලන වාතාවරණය පිළිබඳව ද සැලකිල්ලට ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. ලංකාවේ මෙන්ම එකී රටවල රජවරුන් ද බුද්ධාගමේ ලෞකික ආරක්ෂකයන් වශයෙන් ක්‍රියාකිරීමට පෙළැඹී සිටීම රාජකීයයන් අතර සම්බන්ධතාවයක් ඇතිකළ කරුණක් ලෙස හඳුන්වාදිය හැකිය. ලංකාවේ රජවරුන් මෙන්ම එම රජවරුන් ද භික්ෂු සංඝයාගේ විනය පාරිශුද්ධිය කෙරෙහි සැලකිලිමත් වූහ. එම රජවරුන් අතර ආගමික වශයෙන් පැවති එකඟතාවය ඔවුන් අතර මිත්‍රත්වයක් ඇතිවීමටත් අන්‍යෝන්‍ය සහායන් අපේක්ෂා කිරීමටත් හේතුවූ බව පැහැදිලි කරුණකි. එකී රජ පවුල් අතර ආවාහ විවාහ ඇතිවීමේදී පවා මෙම ආගමික හා සංස්කෘතික පසුබිම ඉවහල් වූ බව පෙනේ. බොහෝ සර්වඥ ධාතූන් නිධන් කර තිබෙන රටක් වශයෙන් අත්කරගෙන තිබුණු කීර්තිය ද ලංකාව කෙරෙහි අග්නිදිග ආසියාතික සැදැහැවතුන්ගේ අවධානය බෙහෙවින් යොමු වූ කරුණකි. විශේෂයෙන් දන්ත ධාතූන් වහන්සේ ලංකාවේ රාජ්‍ය බලයේ සංකේතයක් බවට පත්ව තිබූ නිසා වෙනත් බොහෝ බෞද්ධ රටවල මේ පිළිබඳ ප්‍රචලිත වන්නට විය. එනිසා ස්වකීය රාජ්‍ය බලය පූර්ණතාවයක් ඇති වන්නේ ලංකාවේ තිබෙන දළදා වහන්සේ අත්පත්කර ගැනීමෙන් බවට ක්‍රි.ව 11 වැනි සියවසේ සිට අග්නිදිග ආසියාතික රාජ්‍යවල පාලකයින්ගේ අදහස වූ බව පෙනේ.

දළදා වහන්සේ වැඳපුදා ගැනීම සඳහා වරින් වර වන්දනා කණ්ඩායම් ලංකාවට පැමිණි ආකාරයක් දිස්වේ. ලංකාවේ චෛත්‍යස්ථාන ආදිය වන්දනා කිරීම අග්නිදිග ආසියාතික සැදැහැවතුන් ගේ සිරිතක් විය. දඹදිව පිහිටි සිද්ධස්ථාන වන්දනා කිරීම සිරිතක් කර ගෙන සිටි මෙම රටවල බෞද්ධයන් පවා අනතුරුව දඹදිව බෞද්ධ මධ්‍යස්ථානවල ඇතිවූ අවුල් සහගත ස්වභාවය නිසා ලංකාවේ සිද්ධස්ථාන කෙරෙහි ස්වකීය අවධානය යොමු කරන්නට විය.

තවද මෙම නැගෙනහිර හා අග්නිදිග ආසියාතික රාජ්‍ය අතර සම්බන්ධතා සංස්කෘතික ක්ෂේත්‍රය ඔස්සේ වඩා පුළුල් වන්නට විය. බුරුම පගාන් රාජධානියේ ඇති ගඩොල් ගොඩනැගිලිවලින් අනාවරණය වනුයේ පොළොන්නරුවේ ගෘහ නිර්මාණ ශෛලිය ගුරුකොට ගෙන ඇතැම් බෞද්ධ ගොඩනැගිලි ඉදිවූ බවය. ලංකාවේ චෛත්‍යවල ආකෘතියට අනුව තැනූ ස්තූප කිහිපයක්ම එකී කලාපයේ බෞද්ධ නටබුන් අතර තිබේ. එසේම අග්නිදිග ආසියාතික රාජ්‍යවල පැවති ගෘහ නිර්මාණ ශිල්පය ආශ්‍රයෙන් ප්‍රස්තුත අවධියේ ලංකාවේ නිර්මාණය කරන ලද ගොඩනැගිලි ද මෙම සංස්කෘතික හුවමාරුව සඳහා කදිම නිදසුනකි.

ගොඩනැගිලි ආදිය තැනීමෙන් පමණක් නොව ස්වකීය සඟ සසුන ප්‍රතිසංස්කරණය කිරීමේ දි ද බුරුමය ප්‍රධාන අග්නිදිග ආසියාතික රාජ්‍යයන් ලංකාවේ සඟ සසුනේ ආභාසය ලබාගෙන ඇත. එනම් ක්‍රි.ව 12වැනි සියවසින් පසු උතුරු බුරුමයේ පිහිටුවන ලද සීහළ සංඝ පර්ෂදයේ ව්‍යාප්තිය මේ සඳහා නිදසුනකි. එම සංඝ පර්ෂදය ද පිහිටුවන ලද්දේ බුරුමයෙන් මෙරටටවිත් ලංකාවේ දී උපසම්පදාව ලබා මහාවිහාරයේ ධර්ම විනය පුහුණුවී ලංකාවේ විසූ තෙරවරුන් කිහිපනමක් ද කැටුව සිය රටට ගිය චපට නැමති බුරුම තෙර නමක් විසිනි. උතුරු බුරුමයේ සීහළොපසම්පදාවක් ඇතිවීම ලංකා මහාවිහාර

සම්ප්‍රදායේ ආභාසය කෙළින්ම බුරුම සඟ සසුනට බලපෑ තවත් අවස්ථාවකි. පසුව සිදු කෙරුණු ශාසන සංශෝධනයේ දී ධම්මචේතිය රජතුමා ආදර්ශයට ගෙන ඇත්තේ පොළොන්නරුවේ මහා පරාක්‍රමබාහු රජුගේ සංඝ සංශෝධනයයි. ධම්මචේතිය රජු ශාසන ශෝධනයෙන් පසුව දකුණු බුරුමයේ විසූ සියලුම භික්ෂු සංඝයා සීහළ සංඝ යන නාමයෙන් පෙනී සිටින්නට පටන් ගෙන ඇත.

එමෙන්ම ලංකාවේ ධර්ම විනය සම්ප්‍රදාය කෙරෙහි අග්නිදිග ආසියාතික තෙරවරුන් මෙන්ම බුරුම රජවරුන් ද දැක්වූයේ මහත් ගරු සැලකිල්ලකි. පාළි භාෂාව හා පාළි අට්ඨ කතා සම්ප්‍රදාය මහත් සේ පිළිගෙන ඇත. පගානයේ පැතිර ගිය පාළි භාෂා අධ්‍යයනය හා අධ්‍යාපනය පිළිබඳ උද්යෝගයේ පදනම බුරුම භික්ෂු සංඝයාත් ලංකාවේ මහාවිහාර සම්ප්‍රදායත් අතර තිබුණු මිත්‍ර සම්බන්ධතාවය වේ. ක්‍රි.ව 15වැනි සියවස වනවිට විනය පිළිබඳ ධම්මචේතිය රජු විසින් පරිශීලනය කළ පොත්පත්වලින් වැඩි ප්‍රමාණයක් ලංකාවේ රචනා වූ විනය ග්‍රන්ථ වේ. සැලකිලල්ට ගතයුතු වැදගත් කරුණ වනුයේ පාළි භාෂාව පිළිබඳ මෙම රටවල් අතර පැවති උනන්දුවයි. අග්නිදිග ආසියාතික බොහෝ රටවල මෙන්ම ලංකාවේ ද ලියැවුණු පාළි ග්‍රන්ථ මෙම රටවල් අතර හුවමාරු විය.

ථෙරවාදි භික්ෂු හැම කල්හිම විනය කෙරෙහි ගෞරව සම්පන්නවූ පිරිසකි. එබැවින් විනයානුකූල සංඝ කර්මයන් සම්බන්ධයෙන් ලංකාවේ හා දකුණු ඉන්දියාවේ මෙන්ම අග්නිදිග ආසියාතික තෙරවරු නිතර අන්‍යෝන්‍ය හිත මිත්‍රතාවයෙන් බැඳී සිටියහ. දකුණු ඉන්දියානු සංස්කෘතිය පමණක් නොව දස දහස් ගණනින් මෙරටට සංක්‍රමණය වූ දකුණු ඉන්දියානු ජන කණ්ඩායම් ද නිසා සමාජ සංකරභාවය වැඩිවීමත් භික්ෂූන් මුහුණදුන් බරපතල ආර්ථික දුෂ්කරතාව එවකට භික්ෂු ශාසනයේ පරිහානියට හේතුවිය. එම පසුබිම තුළ ක්‍රි.ව 12වැනි සියවසේ දී දෙවැනි පරාක්‍රමබාහු රජුගේ සංඝ සංශෝධනයෙන් අනතුරුව ලංකාවේ වනවාසි සංඝයාට ප්‍රමුඛත්වය ලැබුණු බව අසන්නට ලැබීම එම රටවල තෙරවරුන්ගේ සිත්ගත් කරුණක් වූ බව පැහැදිලිව පෙනේ. ලංකාවේ වනවාසී තෙරවරුන් වෙතින් උපසම්පදාව හා පුනශික්ෂාව ලබාගැනීම සඳහා එකී රටවල තෙරවරුන් ක්‍රි.ව 11වැනි සියවස සිට ක්‍රි.ව 16වැනි සියවස දක්වා වරින්වර ලංකාවට ආහ. රජවරුන්ගේ හා ප්‍රභූන්ගේ අනුග්‍රහය ඇතිව කණ්ඩායම් වශයෙන් ද වෙළඳුන් සමඟ පෞද්ගලිකව ද උන්වහන්සේලා පැමිණෙන්නට ඇතැයි සිතිය හැකිය. වෙළඳ නැව් පැමිණි අවස්ථාවල ලංකාවේ තෙරවරුන් ද ඉන්දියාව, චීනය හා අග්නිදිග ආසියාතික රටවලට යන්නට ඇත. මෙසේ අන්‍යෝන්‍ය සංස්කෘතික සම්බන්ධතාවයන් පැවතීම මෙම රටවල අධ්‍යාත්මික හා ලෞකික දියුණුවට බෙහෙවින් උපස්ථම්භක විය.

ප්‍රස්තුත අධ්‍යයනය තුළින් අනාවරණය වූ තවත් වැදගත් කරුණක් වනුයේ රජරට සමයේ මෙරට විදේශ සම්බන්ධතාවලදී අනුගමනය කළ ප්‍රතිපත්තියට වඩා වෙනත් ප්‍රතිරූපයක් අපරදිග රාජ්‍ය සම්බන්ධයෙන් ගෙන ගිය බවය. එනම් අනුරාධපුර රාජධානි සමයේ දී ලංකාව ග්‍රීක හා රෝම අධිරාජ්‍ය ප්‍රධාන අපරදිග රාජ්‍යයන් සමඟ අවස්ථා ගනණාවකදී විවිධ ස්වරූපයේ සම්බන්ධතා පැවැත්වූ බව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින් අධ්‍යයනය කිරීමට හැකිවිය. නමුත් ප්‍රස්තුත කාලපරිච්ඡේදය තුළ එපරිද්දෙන් අපරදිග රාජ්‍යයන් සමඟ ඍජුව සම්බන්ධතා පැවැත්වූ බවට තොරතුරු වාර්තා නොවීම කැපී

පෙනෙන ලක්ෂණයකි. එහිදී විශේෂයෙන් ක්‍රි.ව 9වැනි සියවස සිට මධ්‍ය ආසියාතික ප්‍රදේශයේ බලවත්ව වාණිජ හා දේශපාලන අධිකාරීය මෙහෙයවූ අරාබිවරුන් විසින් පෙරඅපර දෙදිග වාණිජ කටයුතු මෙහෙයවන අතරමැදියන් ලෙස ප්‍රමුඛස්ථානයට පත්වීම නිසා ලංකාව ප්‍රධාන සෙසු පෙරදිග රටවල් සමඟ අපරදිග රාජ්‍යයන්ට ඍජුව කටයුතු කිරීමට අවස්ථාව උදා නොවීය. එසේම මෙම තත්ත්වයට අපරදිග රාජ්‍යයවල ඒවනවිට ක්‍රියාත්මක වූ දේශපාලන, ආර්ථික හා ආගමික පසුබිම ද ඉවහල්වූ ආකාරයක් දක්නට ලැබේ.

සමස්තයක් ලෙස ගත්කළ පොළොන්නරුව රාජධානිය බිඳවැටීමේ සිට කෝට්ටේ රාජධානිය ආරම්භය දක්වා සියවස් දෙකකට ආසන්න කාලයක ලංකාව වෙනත් රාජ්‍යයන් හා පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ සිදුකළ මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ මූලික කරුණු කිහිපයකි. ඒවා අතර රජරට අවධියේ සිට ඉන්දියානු උපමහාද්වීපය සමඟ පැවැත්වූ සම්බන්ධතා මෙම කාලවකවානුව තුළ ද වඩාත් පෘථුලවීමක් දක්නට ලැබෙන අතර නැගෙනහිර ආසියාවේ සමකාලීනව නැගී එමින් සිටි පෙරදිග අධිරාජ්‍ය වූ චීනය සමඟ දේශපාලන සම්බන්ධතා ගොඩනගා ගැනීමත් රජරට සමයට වඩා අග්නිදිග ආසියාතික රාජ්‍යයන් සමග  දේශපාලනික, ආගමික හා සංස්කෘතික සම්බන්ධතා ජාලයක් ගොඩනැගීමත් දක්නට ලැබේ. ඊට අමතරව ප්‍රථමවරට අප්‍රිකානු මහාද්වීපයේ රාජ්‍යයන් සමඟ වාණිජ සම්බන්ධතා ගොඩනැගීම මේ අවධියේ සිදුවූ තවත් වැදගත් සිදුවීමකි. මෙසේ ලංකාව ලොව සිව්දිග රාජ්‍යයන් සමඟ දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික හෝ සංස්කෘතික යන සියලුම අංශයන් යටතේ සම්බන්ධතා ජාලයක් පවත්වාගෙන යෑම නිසා මෙකල විදේශ සම්බන්ධතා පැවත්වීම සංකීර්ණතාවයට පත්ව ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස එනිසා ක්‍රි.ව 16වැනි සියවස වනවිට යුරෝපා ආගමනය හරහා මෙරට ඉතිහාසය වෙනස් මඟකට යොමුවීමට මෙම සබඳතා පැවැත්වීමේ වර්ධනීය අවස්ථා ඉවහල් වූ බව දැකගත හැකිය.